(නවවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 3(4).]

# පාර්ලිමේන්තුවේ අංක 3 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2021 පෙබරවාරි 25 බ්‍රහස්පතින්දා**

---

**2021 මාර්තු 09 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

44/2020

ගරු හේෂා විතානගේ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක හදබිම අධිකාරිය නමින් ආයතනයක් තිබේද;

(ii) එසේ නම්, එම ආයතනයේ ප්‍රධාන කාර්යයන් කවරේද;

(iii) එම ආයතනයේ ප්‍රධාන කාර්යාලය පවත්වා ගෙන යනු ලබන ගොඩනැගිල්ලේ නම හා ලිපිනය කවරේද;

(iv) මෙම ගොඩනැගිල්ලට මාසිකව හා වාර්ෂිකව ගෙවනු ලබන කුළිය කොපමණද;

(v) කෘෂිකර්ම අමාත්‍යාංශය පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ලේම මෙම ආයතනය ස්ථාපිත කිරීමට අමාත්‍යාංශය සතු වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

144/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— විදුලිබල අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉදිරි වර්ෂ 5 සඳහා ශ්‍රී ලංකාවේ විදුලිබල අවශ්‍යතාවය පිළිබඳ පුරෝකථනයක් කර තිබේද;

(ii) එසේ නම්, ඉදිරි වර්ෂ 5 සඳහා ශ්‍රී ලංකාවේ විදුලිබල අවශ්‍යතාවය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන්නේද;

(iii) ඉහත සඳහන් කාලය තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති ජනන සැලැස්මේ විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

175/2020

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අවිස්සාවේල්ල, නැගෙනහිර හේවාගම් කෝරළයේ විවිධ සේවා සමූපකාර සමිතිය විසින් පාලනය කරනු ලබන ග්‍රාමීය බැංකු 24ක, මුදල් තැන්පත් කරන ලද 115,000ක් පමණ වන තැන්පත්කරුවන්ට අයත්වන රුපියල් කෝටි 95ක තැන්පතු මුදල්, 2015 වර්ෂයේ සිට එම තැන්පත්කරුවන්ට ආපසු ලබා දී නොමැති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම තැන්පත් මුදල්, අදාළ තැන්පත්කරුවන්ට ලබා දීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(ii) එම තැන්පත් මුදල්, අදාළ තැන්පත්කරුවන්ට ලබා දීම සඳහා ගත වන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

237/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂය තුළ —

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ ගම්මිරිස් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය වූ මුදල කොපමණද;

(iii) එම ගම්මිරිස් ආනයනය කළ රටවල් කවරේද;

(iv) එම ගම්මිරිස් ආනයනය කළ සමාගම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට ගම්මිරිස් ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

269/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ රජයේ පාසල්වල අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ටැබ් පරිගණක (Tab) ලබා දීමේ වැඩසටහන සඳහා මුදල් වෙන් කරන ලද අයවැය කවරේද;

(ii) එම වැඩසටහන සඳහා වෙන් කරන ලද මුදල කොපමණද;

(iii) එම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ටෙන්ඩර් කැඳවීමක් සිදු කර තිබේද;

(iv) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(v) ඉහත ආයතන අතරින් එම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා තෝරාගත් ආයතනයේ නම කවරේද;

(vi) ටෙන්ඩර් කැඳවීමේදී ඉදිරිපත් කරන ලද පිරිවිතර කවරේද;

(vii) මේ වනවිට අදාළ ටැබ් පරිගණක මිලදී ගෙන තිබෙද;

(viii) ශ්‍රී ලංකාවේ රජයේ පාසල්වල අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ හදාරන සියලුම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට හා උසස් පෙළ ශ්‍රේණි සඳහා උගන්වනු ලබන සියලුම ගුරුවර ගුරුවරියන්ට ටැබ් පරිගණක ලබා දීමට අපේක්ෂා කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

534/2020

ගරු රෝහණ බංඩාර මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටි සීමාසහිත ලංකා සතොස ආයතනයට අයත් ශාඛා සංඛ්‍යාව කොපමණද;

(ii) එම ශාඛාවන් පිහිටි ස්ථානවල ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) සීමාසහිත ලංකා සතොස ශාඛා ජාලය අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ තවදුරටත් ව්‍යාප්ත කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

585/2020

ගරු වේලු කුමාර් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතු තේ වතු විශාල සංඛ්‍යාවක් මධ්‍යම පළාතේ පිහිටා ඇති බවත්;

(ii) ඒවා දීර්ඝ කාලයක සිට පාඩු ලබන බවත්;

(iii) එම වතුවල සේවය කොට විශ්‍රාමික කම්කරුවන්ගේ පාරිතෝෂික දීමනාව, සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලේ ප්‍රතිලාභ ලබා දී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මධ්‍යම පළාත තුළ පිහිටා ඇති ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් තේ වතු සංඛ්‍යාව කොපමණද;

(ii) එම වතුවල නම් සහ පිහිටා ඇති දිස්ත්‍රික්ක කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත (ආ) (i) හි සඳහන් වතුවල පිහිටා ඇති තේ කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් මේ වනවිට ක්‍රියාත්මකව පවතින කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද;

(iii) එම කර්මාන්තශාලා අතරින් බාහිර පාර්ශ්වයන්ට බදු දී ඇති කර්මාන්තශාලා සංඛ්‍යාව සහ එම කර්මාන්තශාලාවල නම් කවරේද;

(iv) එම කර්මාන්තශාලා අතරින් මේ වනවිට වසා දමා ඇති කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද;

(v) එම කර්මාන්තශාලා නැවත විවෘත කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

658/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාවේ පිහිටා ඇති දුම්රිය ස්ථාන ක්‍රමානුකූලව සංවර්ධනය කළ යුතු බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) අලව්ව දුම්රිය ස්ථානය සංවර්ධනය කිරීම සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

(ii) එහි සංවර්ධන කටයුතු සිදුකරනු ලබන ආයතනයේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) අලව්ව දුම්රිය ස්ථානයේ සංවර්ධන කටයුතු වර්ෂ ගණනාවක් තිස්සේ ප්‍රමාද වී ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම සංවර්ධන කටයුතු කඩිනම් කිරීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

666/2020

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කුරුණෑගල නගරාධිපතිවරයා විසින් අත්තනෝමතිකව විනාශ කරන ලද්දේ කුරුණෑගල නගර මධ්‍යයේ පැවති ඉපැරණි ගොඩනැගිල්ලක් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වනවිට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් එම ගොඩනැගිල්ල පැවති භූමියේ කැනීම් කටයුතු ආරම්භ කර තිබේද;

(ii) විනාශ කරන ලද එම ගොඩනැගිල්ල අයත්වන යුගය කවරේද;

(iii) එම ගොඩනැගිල්ලේ ඇති ඓතිහාසික වටිනාකම කවරේද;

(iv) ගොඩනැගිල්ල පිළිසකර කර සංරක්ෂණය කිරීමට කටයුතු කරන්නේද;

(v) එකී ගොඩනැගිල්ලේ පිළිසකර කිරීම සඳහා වැය වන මුදල කොපමණද;

(vi) එම මුදල වැය කිරීමට අපේක්ෂා කරනු ලබන අරමුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

856/2020

ගරු නලින් ප්‍රනාන්දු මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීමාසහිත ලංකා සතොස ආයතනය විසින් මේ වනවිට ආරම්භ කර ඇති ශාඛා අලෙවිසැල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් වාර්ෂිකව ලාභ ලබන හා අලාභ ලබන ශාඛා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම අලාභ ලබන ශාඛා, ලාභ ලබන තත්ත්වයට පත් කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(iv) එම අලාභ ලබන ශාඛා වසා දැමීමට කටයුතු කරන්නේද;

(v) එසේ නම්, ඒ මන්ද;

(vi) නව ශාඛා ආරම්භ කිරීමේදී සීමාසහිත ලංකා සතොස ආයතනය විසින් අනුගමනය කරනු ලබන ක්‍රියා පටිපාටිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය (අංක 1),— 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3(4) වගන්තිය යටතේ ෂැන්ග්‍රි-ලා හොටෙල්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2020 දෙසැම්බර් 18 දිනැති අංක 2206/18 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.02.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය (අංක 2),— 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3(4) වගන්තිය යටතේ සිනෝලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (ප්‍රයිවට්) ලිමිටඩ් සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2020 දෙසැම්බර් 18 දිනැති අංක 2206/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.02.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— විදේශ විනිමය පනත යටතේ නියෝගය,— 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වගන්තිය සමඟ කියවිය යුතු 29 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2020 නොවැම්බර් 17 දිනැති අංක 2202/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.02.23 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ වැටුප හා දීමනා ප්‍රතිශෝධනය කිරීම,— 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 16(1) වගන්තිය මඟින් කොමිෂන් සභාවට පැවරී ඇති කාර්යයන් ඉටු කරලීම පිණිස එම කොමිෂන් සභාවට සහාය වීමට අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු පත් කිරීමට සහ එම තනතුර දරන තැනැත්තාට පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලබන වැටුපක් ගෙවීමට විධිවිධාන සලස්වා දී ඇති හෙයින් ද;

2015 වර්ෂයේදී අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට පත් වූ ජනාධිපති නීතිඥ, ඒ. ඒ. පී. දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ මහත්මිය හා 2016 වර්ෂයේදී එම තනතුරට පත් වූ ජනාධිපති නීතිඥ, සරත් ජයමාන්න මහතා විසින් ඔවුන් කලින් දරන ලද තනතුරේ වැටුප් හා දීමනා අධ්‍යක්ෂ ජනරාල් තනතුරට පත්වීමෙන් පසු ලැබෙන වැටුප් හා දීමනාවලට වඩා වැඩි අගයක් වන නිසා එම නිලධාරීන්ට ගෙවිය යුතු වැටුප් හා දීමනා ප්‍රතිශෝධනය කිරීම සඳහා අමප/16/0947/702/040 හා 2016.06.14 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කටයුතු කර ඇති හෙයින්ද;

ජනාධිපතිවරයා විසින් අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරන ලද 2020.02.18 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාළ අමප/20/0443/201/012 හා 2020.02.19 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට මහාධිකරණ විනිසුරුවරයෙකු ලෙස රාජකාරි කළ ඩබ්ලිව්. කේ. දමිත් විජේරත්න මහතා 2020.01.21 දින සිට පත් කර ඇති හෙයින් ද;

ඩබ්ලිව්. කේ. දමිත් විජේරත්න මහතා වර්තමාන තනතුරට පත්වීමෙන් පසු ඔහුට ලැබීමට නියමිත වැටුප පූර්ව තනතුරේ වැටුප හා දීමනාවලට වඩා ඉතා අඩු අගයක් ගන්නා හෙයින් ද;

ඩබ්ලිව්. කේ. දමිත් විජේරත්න මහතාගේ අධ්‍යාපන පසුබිම, වෘත්තීමය හැකියාව පිළිබඳ සලකා බලා රජයේ අවශ්‍යතාවය මත ඔහු අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට පත්කර ඇති හෙයින් ද, මීට ඉහත පූර්වාදර්ශ අනුව ඔහුගේ පූර්ව තනතුර වන මහාධිකරණ විනිසුරු ධූරයට අදාළ වැටුප හා දීමනා ඔහුට පෞද්ගලික වන ලෙස 2020.01.30 දින සිට පහත පරිදි ගෙවීමට 2020.02.19 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමතිය ලබා දී ඇති හෙයින් ද:—

(අ) මහාධිකරණ විනිසුරු තනතුරට හිමි මාසික වැටුප හා සියලු දීමනා ඒ ආකාරයෙන් ම 2020.01.30 දින සිට ලබා දීමට; සහ

(ආ) වර්තමාන තනතුරට අදාළ නිල නිවාසය හා නිල වාහනය භාවිතා කරන්නේ නම්, ඊට අදාළ වන දීමනා නොගෙවීමටත්;

ඊට අනුකූලව, 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්, ඩබ්ලිව්. කේ. දමිත් විජේරත්න මහතාට ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන පරිදි ඉහත සඳහන් මාසික වැටුප හා දීමනා ගෙවීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

**2021 මාර්තු 10 බදාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

45/2020

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගුවන් සේවා සැපයීම වෙනුවෙන් ශ්‍රී ලංකා ගුවන් හමුදාවට රාජ්‍ය ආයතනවලින් අයවිය යුතු හිඟ මුදල් තිබේද;

(ii) එසේ නම්, එම එක් එක් රාජ්‍ය ආයතනයේ නම, හිඟ මුදල සහ හිඟ පවතින කාලය වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කරන්නේද;

(iii) එම හිඟ මුදල් අයකර ගැනීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

194/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික ක්‍රීඩා සභාව සඳහා පත් කරන ලද නව සාමාජික සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් සහ සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ක්‍රීඩාවේ සංවර්ධනය සඳහා ඔවුන්ගෙන් ලබා ගැනීමට අපේක්ෂිත සේවය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

238/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂය තුළ —

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ එතනෝල් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය වූ මුදල කොපමණද;

(iii) එම එතනෝල් ආනයනය කළ රටවල් කවරේද;

(iv) එම එතනෝල් ආනයනය කළ සමාගම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට එතනෝල් ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

351/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදේශීය තරඟකාරී නිෂ්පාදන ආනයනය කිරීම හේතුවෙන් දේශීය නිෂ්පාදකයන්ට අහිතකර බලපෑම් එල්ල වී ඇති බවත්;

(ii) ඒ හේතුවෙන් ඔවුනට තම නිෂ්පාදන අළෙවි කර ගැනීම අපහසු වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) සීමාසහිත ලංකා සතොස ආයතනයට අළෙවි ද්‍රව්‍ය ලබා ගැනීමේදී දේශීය නිෂ්පාදකයන්ට ප්‍රමුඛතාවය ලබා දීමට ක්‍රමවේදයක් සකස් කර තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රමවේදය කවරේද;

(iii) නොඑසේ නම්, ක්‍රමවේදයක් සකස් කිරීමට පියවර ගන්නේද;

(iv) එසේ නම්, එම ක්‍රමවේදය සකස් කරනු ලබන ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

589/2020

ගරු වේලු කුමාර් මහතා,— රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මහනුවර මහ නගර සභාවේ සේවයේ නියුතු කම්කරුවන් පදිංචි වී සිටින මහයියාව ගම්මානය මහ නගර සභා බලප්‍රදේශය තුළ පිහිටා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ගම්මානය ආරම්භ කරන අවස්ථාවේදී ඉදිකරන ලද නිවාස සංඛ්‍යාව;

(ii) එම අවස්ථාවේදී පදිංචි කරන ලද පවුල් සංඛ්‍යාව;

(iii) මේ වනවිට එම ගම්මානයේ පවතින ලියාපදිංචි අංක සහිත විදුලි පහසුකම් ඇති නිවාස සංඛ්‍යාව;

(iv) එම නිවාසවල පදිංචිව සිටින පවුල් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) පසුගිය කාලයේදී මහයියාව ගම්මානය සඳහා වූ නව නිවාස යෝජනා ක්‍රමයක් සැලසුම් කළ බව දන්නේද?

(ii) එසේ නම්, එම නිවාස යෝජනා ක්‍රමය පිළිබඳව විස්තර කරන්නේද;

(iii) එම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

667/2020

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— මහා මාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) A – 17 මාර්ගයේ හේයස්ට් තේ කර්මාන්තශාලාව අසලින් ගොන්ගල දෙසට වන මාර්ගය, මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සංවර්ධනය කරන්නේද;

(ii) එම මාර්ගය, මාර්ග සංවර්ධන අධිකාරියට අයත් වන්නේද;

(iii) මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වැය කරනු ලබන මුදල කොපමණද;

(iv) එම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා ප්‍රමුඛතාවයක් ලබා දීමට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

865/2020

ගරු අමරකීර්ති අතුකෝරළ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සඳහා අනුමත සේවක සංඛ්‍යාවක් ඇති බව එතුමා දන්නේද;

(ii) එසේ නම්, එම සංඛ්‍යාව කොපමණද;

(iii) එම සංඛ්‍යාව ස්ථිර හා අනියම් වශයෙන් කොපමණද;

(iv) 2015 වර්ෂයේදී සංස්ථාවේ ස්ථිර සහ අනියම් සේවක සංඛ්‍යාව කොපමණද;

(v) වර්ෂ 2015 සිට 2019 දක්වා බඳවාගෙන ඇති ස්ථිර, අනියම් සහ කොන්ත්‍රාත් සේවක සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා වූ කාලයේදී වෙනත් අමාත්‍යාංශවලට මුදා හැර සිටි සංස්ථාවේ සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ට ගෙවූ වැටුප් අදාළ අමාත්‍යාංශවලින් ප්‍රතිපූරණය කරගෙන තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම ආයතනයට බඳවාගෙන සිටි සේවකයන් 98ක්, 2015 මහ මැතිවරණය ඉලක්ක කර ගනිමින් වෙනත් අමාත්‍යාංශ වෙත මුදා හැර සිටි බව දන්නේද;

(ii) එසේ නම්, එම සේවකයන්ට ගෙවා ඇති වැටුප් සහ අතිකාල දීමනාවල වටිනාකම කොපමණද;

(iii) එම මුදල් ප්‍රතිපූරණය කර ගෙන තිබේද;

(iv) එම සේවකයන් මුදා හැරීමට කටයුතු කළ නිලධාරින්ට එරෙහිව ගත් ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1020/2020

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා එවකට පැවති වෙළඳ, වාණිජ හා පාරිභෝගික කටයුතු අමාත්‍යාංශය භාරව කටයුතු කළ අමාත්‍යවරුන්ගේ නම් කවරේද;

(ii) එම අමාත්‍යාංශයට අයත්ව තිබූ ආයතනවල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අ(i) හි සඳහන් කාල සීමාව තුළ සමූපකාර තොග වෙළඳ සංස්ථාව, සීමාසහිත ලංකා සතොස සහ විවිධ සේවා සමූපකාර සමිති විසින් පවත්වාගෙන යනු ලබන වෙළඳ ආයතන සඳහා අවශ්‍ය වන භාණ්ඩ තොග ආනයනය කිරීමේදී හෝ දේශීයව මිලදී ගැනීමේදී අනුගමනය කර ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) ඉහත ආයතන සඳහා භාණ්ඩ තොග ආනයනය කිරීමේදී හෝ දේශීයව මිලදී ගැනීමේදී විනිවිදභාවයකින් කටයුතු කර තිබේද;

(iii) නොඑසේ නම්, යම් අක්‍රමිකතාවයක් සිදු වී තිබේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් පූර්ණ විගණනයක් සිදු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2021 මාර්තු 10 බදාදා)**

1354/2020

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලයේ සහ අග්‍රාමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ සේවය කරන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සේවකයන් සංඛ්‍යාව විධායක හා අනෙකුත් ශ්‍රේණි අනුව කොපමණද;

(iii) එම එක් එක් සේවකයා සඳහා ලබා දෙනු ලබන වැටුප්, දීමනා සහ අනෙකුත් වරප්‍රසාද කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1355/2020

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ජනාධිපති ලේකම් කාර්යාලයේ සහ ජනාධිපතිවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ සේවය කරන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සේවකයන් සංඛ්‍යාව විධායක හා අනෙකුත් ශ්‍රේණි අනුව කොපමණද;

(iii) එම එක් එක් සේවකයා සඳහා ලබා දෙනු ලබන වැටුප්, දීමනා සහ අනෙකුත් වරප්‍රසාද කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2021 මාර්තු 12 සිකුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

46/2020

ගරු හේෂා විතානගේ මහතා,— විදුලිබල අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සබරගමුව පළාතේ අඩු ආදායම්ලාභී පවුල් සඳහා විදුලිය ලබා දීමට වැඩසටහනක් දියත් කර තිබේද;

(ii) පසුගිය යහපාලන රජය බලයට පත්වූ දින සිට මේ දක්වා එම වැඩසටහන යටතේ විදුලිය ලබා දී ඇති පවුල් සංඛ්‍යාව එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම පවුල් තෝරා ගැනීමේ දී අනුගමනය කරන ලද ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

176/2020

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාලු පාරේ කොළඹ සිට මොරටුව දක්වා පවතින අධික මාර්ග තදබදය අවම කිරීමේ අරමුණින් සිදු කරනු ලබන මුහුදුබඩ මාර්ගයේ (Marine Drive) ඉදිකිරීම් කටයුතු, කොල්ලුපිටියේ සිට දෙහිවල - වාසල පාර දක්වා පමණක් සිදු කර ඇති බවත්;

(ii) එම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ඉතා මන්දගාමී බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය කොපමණද;

(ii) එම ව්‍යාපෘතියට අදාළ කොන්ත්‍රාත්තුව ලබා ගත් ආයතනයේ නම කවරේද;

(iii) ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු නිම කිරීමට අපේක්ෂා කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම ව්‍යාපෘතිය හේතුවෙන් දේපළ අහිමිවන්නන් සඳහා ලබා දී ඇති වන්දි මුදල කොපමණද;

(ii) වන්දි මුදල් ලබා දීමට තවදුරටත් ඉතිරිව තිබේ නම්, එම මුදල් ලබා දීමට අපේක්ෂා කරනු ලබන දින වකවානු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

195/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— විදුලිබල අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) නොරොච්චෝල ප්‍රදේශයේ සුළං විදුලි බලාගාරයක් පිහිටා තිබෙන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම බලාගාරය තුළින් ජනනය කරනු ලබන විදුලි ඒකක සංඛ්‍යාව කොපමණද;

(ii) එම විදුලි බලාගාරයේ ට්‍රාන්ස්ෆෝමරය අක්‍රිය වූ දිනය හා එය නැවත ප්‍රතිසංස්කරණය කළ දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) බලාගාරය තවදුරටත් සංවර්ධනය කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

239/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂය තුළ —

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ සුදු ලූනු ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය වූ මුදල කොපමණද;

(iii) එම සුදු ලූනු ආනයනය කළ රටවල් කවරේද;

(iv) එම සුදු ලූනු ආනයනය කළ සමාගම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට සුදු ලූනු ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

352/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේ මූලික අරමුණින් හෝටල් සහ ආපනශාලා වෙත මද්‍යසාර විකිණීම සඳහා බලපත්‍ර ලබා දෙන බවත්;

(ii) සංචාරකයන් නොගැවසෙන ප්‍රදේශවල පිහිටා ඇති ඇතැම් හෝටල් සහ ආපනශාලා වෙතද මද්‍යසාර විකිණීම සඳහා බලපත්‍ර ලබා දී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) 2018 සහ 2019 වර්ෂවලදී හෝටල් සහ ආපනශාලා වෙත මද්‍යසාර විකිණීම සඳහා ලබා දෙන ලද බලපත්‍ර සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම බලපත්‍ර ලබා දී ඇති හෝටල් සහ ආපනශාලා පිහිටා ඇති ප්‍රදේශ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) සංචාරක කර්මාන්ත ප්‍රවර්ධනය කිරීමේ මුවාවෙන් ශ්‍රී ලංකාව පුරා පවත්වාගෙන යනු ලබන මද්‍යසාර අළෙවි ස්ථාන වැඩිවීමෙන් මද්‍යසාර භාවිතය ඉහළ යන බැවින් මද්‍යසාර විකිණීම සඳහා බලපත්‍ර ලබාදීමේ ක්‍රමවේදය වෙනස් කිරීමට කටයුතු කරන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

535/2020

ගරු රෝහණ බංඩාර මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ වනතෙක් එක් එක් කන්නයේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ වී අස්වැන්න;

(ii) එම වී අස්වැන්නෙන් වී අළෙවි මණ්ඩලය විසින් එක් එක් කන්නයේ දී මිලදී ගත් වී ප්‍රමාණය;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවීන්ගේ වී අස්වැන්නෙන් වැඩි ප්‍රමාණයක්, වී අළෙවි මණ්ඩලය මඟින් ඉදිරියේදී මිලදී ගැනීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

605/2020

ගරු ඉෂාක් රහුමාන් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව 2020/2021 මහ කන්නයේ වගා කටයුතු සඳහා රසායනික පොහොර නොමිලේ ලබා දෙන්නේද;

(ii) එසේ නම්, වගා කරනු ලබන මුළු බිම් ප්‍රමාණයටම පොහොර ලබා දෙන්නේද;

(iii) වී වගා කරන මුළු බිම් ප්‍රමාණයටම පොහොර ලබා දෙන්නේද;

(iv) එසේ නම්, වී වගා කරනු ලබන එක් අක්කරයක් සඳහා එක් එක් පොහොර වර්ගවලින් ලබා දෙනු ලබන පොහොර ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) අතිරේක බෝග වගා කිරීම සඳහා අක්කරයකට ලබා දෙනු ලබන පොහොර ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

659/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල නගරය, ශ්‍රී ලංකාවේ ඇති ප්‍රධානතම නගරයක් බවත්;

(ii) එම නගරය ක්‍රමානුකූලව සංවර්ධනය කළ යුතු බවත්:

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) කුරුණෑගල නගරය ක්‍රමවත්ව සංවර්ධනය කිරීම සඳහා මේ වනවිට සැලසුමක් සකස් කර තිබේද;

(ii) එසේ නම්, සැලසුම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන අරමුදල් සපයා ගැනීම සඳහා වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

(iii) එසේ නම්, එම අරමුදල් සපයා ගනු ලබන ප්‍රභවයන් කවරේද;

(iv) කුරුණෑගල නගරය සංවර්ධනය කිරීමේ කටයුතු කඩිනම් කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

723/2020

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා,— රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මන්නාරම සහ මුලතිව් දිස්ත්‍රික්ක තුළ මේ වනතෙක් ගිනි නිවීම් ඒකකයක් නොමැති වීමෙන් අනපේක්ෂිත ගිනි ගැනීම් සිදුවන අවස්ථාවන්හිදී ජීවිත සහ දේපළ හානි සිදු වන බවත්;

(ii) මන්නාරම නගර සභාව සහ මුලතිව් කරෙයිතුරෙයිපත්තු ප්‍රාදේශීය සභාව සඳහා ගිනි නිවීම් ඒකක ලබා දෙන බවට පොරොන්දු වුවද, මේ වනතෙක් ගිනි නිවීම් ඒකක ලබා දී නොමැති බවත්;

(iii) මන්නාරම සහ මුලතිව් දිස්ත්‍රික්කවල ගිනි ගැනීම් සිදු වන අවස්ථාවන්වලදී වවුනියාවේ සිට ගිනි නිවීමේ රථයක් පැමිණිය යුතු අතර ඒ සඳහා පැය එක හමාරක පමණ කාලයක් ගත වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මන්නාරම සහ මුලතිව් දිස්ත්‍රික්ක සඳහා ගිනි නිවීම් ඒකක ලබා දෙනු ලබන දිනය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

859/2020

ගරු ජගත් කුමාර මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පොදු ප්‍රවාහන පද්ධතිය ශක්තිමත් කිරීමේ වැඩපිළිවෙළ යටතේ බස්රථ, දුම්රිය සහ ත්‍රීරෝද රථ යන ප්‍රවාහන මාධ්‍යයන් සංවර්ධනය කිරීම සඳහා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) ශ්‍රී ලංකාවේ වර්තමාන ප්‍රවාහන පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍යවන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් රථ හා පෞද්ගලික බස් රථ සංඛ්‍යාව කොපමණද ;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ රියදුරු හා කොන්දොස්තර තනතුරුවල පුරප්පාඩු පවතින බව පිළිගන්නේද?

(ii) එසේ නම්, එම තනතුරුවල පවතින පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) තලංගම ඩිපෝව මඟින් ප්‍රවාහන කටයුතු සඳහා යොදවා තිබෙන බස් රථ සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ සඳහා ප්‍රමාණවත් රියදුරන් හා කොන්දොස්තරවරුන් ඇතුළු කාර්ය මණ්ඩලයක් සිටින්නේද;

(iii) එසේ නම්, එම සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) නොඑසේ නම්, ප්‍රවාහන කටයුතු සිදුකරන ආකාරය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2021 මාර්තු 12 සිකුරාදා)**

1361/2020

ගරු අනුර දිසානායක මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ පිහිටා ඇති ගංගාවලින් හා වැලි නිධිවලින් වැලි ඉවත් කිරීම සඳහා මේ වනවිට ලබා දී ඇති බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත සඳහන් බලපත්‍ර ලබා දී ඇති වැලි තොටුපොළවල නම් කවරේද;

(iii) එම එක් එක් බලපත්‍රය නිකුත් කරන ලද වර්ෂය සහ බලපත්‍රලාභියාගේ නම වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) 2019 හා 2020 වර්ෂවලදී ඉහත සඳහන් එක් එක් බලපත්‍රලාභියා විසින් ඉහත සඳහන් එක් එක් තොටුපොළින් ගොඩදමන ලද වැලි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2021 මාර්තු 23 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

25/2020

ගරු හේෂා විතානගේ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා ධාවනයෙන් ඉවත් කරන ලද දුම්රිය මැදිරි සංඛ්‍යාව කොපමණද;

(ii) එම දුම්රිය මැදිරි අතරින් අලුත්වැඩියා කර නැවත ධාවනයට එක් කරන ලද දුම්රිය මැදිරි සංඛ්‍යාව කොපමණද;

(iii) එම දුම්රිය මැදිරි අලුත්වැඩියා කරන ලද ආයතනයේ නම කවරේද;

(iv) ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(v) ධාවනයෙන් ඉවත් කරන ලද සෙසු දුම්රිය මැදිරි යළි ධාවනයට එක් කිරීම සඳහා අමාත්‍යාංශය සතු වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

171/2020

ගරු එස්.එම්. මරික්කාර් මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ලෝලෙවල් මාර්ගයේ අඹතලේ සිට ඔරුගොඩවත්ත දක්වා කොටසේ සංවර්ධන කටයුතු සම්පූර්ණ කර නොමැති බව දන්නේද;

(ii) එසේ නම්, එම මාර්ගය සංවර්ධනය කිරීම ප්‍රමාද වීමට හේතුවන කරුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම මාර්ගයේ මේ වනවිට සංවර්ධන කටයුතු නිම කර ඇති ප්‍රමාණය සහ තවදුරටත් නිම කිරීමට ඉතිරිව ඇති ප්‍රමාණය;

(ii) මෙම මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය හේතුවෙන් දේපල අහිමිවූවන් අතරින් මේ වනවිට වන්දි ලබා දී ඇති පුද්ගලයන් සංඛ්‍යාව සහ වන්දි මුදල;

(iii) තවදුරටත් වන්දි ලබා දීමට ඉතිරිව ඇත්නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, වන්දි මුදල සහ එම වන්දි ලබා දීමට අපේක්ෂිත දිනය;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

181/2020

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය, ඌර්කාවට්තුරයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, එලුවයිතිවු 4වන කලාපයේ පදිංචිව සිටි දියණියන් සයදෙනෙකුගේ පියකුවූ ඇන්ටනි යේසුදාසන් මහතා, 2014.12.19 දින එලුවයිතිවු මුහුදේ ධීවර කටයුතුවල යෙදී සිටියදී, නාවික හමුදාවේ ඩෝරා යාත්‍රාවක ගැටීමෙන් ජීවිතක්ෂයට පත්වූ බවත්;

(ii) නාවික හමුදාවේ නොසැළකිල්ලෙන් වූ මෙම අනතුරින් අසරණ වූ ඔහුගේ දියණිවරුන්ට වන්දියක් ලබාදෙන බවට පොරොන්දු වී ඇති බවත්;

(iii) මේ දක්වා වන්දි ලබා දී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම දරුවන්ට වන්දි ලබා දෙනු ලබන දිනය කවරේද;

(ii) මරණය සම්බන්ධයෙන් මීට සිව් වසරකට පෙර නඩුවක් පවරා ඇති බව දන්නේද;

(iii) එසේ නම්, නඩු අංකය, පැවරූ අය හා පැවරූ අධිකරණය කවරේද;

(iv) යාත්‍රාවක ගැටී මියගිය බවට ප්‍රබල සාක්ෂි අධිකරණයට ඉදිරිපත් කළද මෙතෙක් යුක්තිය ඉටු නොවූයේ මන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඔවුනට නාවික හමුදාව සහ පොලීසිය විසින් බලපෑම් කරන බව දන්නේද;

(ii) දරුවන්ට එවැනි බලපෑමක් නොකිරීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

196/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— විදුලිබල අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පැය නවයක් පුරා ශ්‍රී ලංකාවේ විදුලිය විසන්ධි වූ දිනය කවරේද;

(ii) එකී විදුලිය විසන්ධි වීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට සිදු වූ අලාභය ගණනය කර තිබේද;

(iii) එසේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

240/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂය තුළ—

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ සුවඳ විලවුන් සහ රූපලාවන්‍ය ද්‍රව්‍ය ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය වූ මුදල කොපමණද;

(iii) එම සුවඳ විලවුන් සහ රූපලාවන්‍ය ද්‍රව්‍ය ආනයනය කළ රටවල් කවරේද;

(iv) එම සුවඳ විලවුන් සහ රූපලාවන්‍ය ද්‍රව්‍ය ආනයනය කළ සමාගම්වල නම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට සුවඳ විලවුන් සහ රූපලාවන්‍ය ද්‍රව්‍ය ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

263/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2018-2019 මහ කන්නයේදී ගංවතුර උවදුර හේතුවෙන් මාතර දිස්ත්‍රික්කයේ වගා හානි වූ බවත්;

(ii) මේ වනතෙක් ඒ සඳහා වන්දි මුදල් ගෙවා නොමැති බවත්;

(iii) ඒ හේතුවෙන් ගොවීන් දුෂ්කරතාවයට පත්ව ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) උක්ත කන්නය තුළදී මාතර දිස්ත්‍රික්කයේ හානි වූ වගා බිම් ප්‍රමාණය;

(ii) වන්දි මුදල් ගෙවිය යුතු ගොවීන් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙතෙක් වන්දි මුදල් නොගෙවීමට හේතු කවරේද;

(ii) උක්ත වන්දි මුදල් ගෙවීමට කටයුතු කරන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

431/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ මධ්‍යම අධිවේගී මාර්ගය මේ වනවිට ඉදිකරමින් පවතින බවත්;

(ii) එම අධිවේගී මාර්ගයේ කොටසක් අලව්ව හා නාරම්මල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස හරහා ඉදිකරන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ඉහත ප්‍රදේශවල ජීවත්වන පවුල්වලින් අත් කරගත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම අත් කර ගැනීම් වෙනුවෙන් සාධාරණ වන්දි මුදලක් ප්‍රදානය කර තිබේද;

(iii) නොඑසේ නම්, සාධාරණ වන්දි මුදලක් ප්‍රදානය කිරීම සඳහා සැලසුම් කර ඇති වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

457/2020

ගරු ඉෂාක් රහුමාන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, ගල්කිරියාගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාසයේ, ගල්කිරියාගම පවුල් සෞඛ්‍ය සේවා නිලධාරි වසමේ, මාතෘ සායනයක් පැවැත්වීම සඳහා සුදුසු ස්ථානයක් නොමැති බවත්;

(ii) ඉහත සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ ඇති, කිසිදු පහසුකමක් නොමැති කුඩා කාමරයක මේ වනවිට මෙම සායනය පවත්වන බවත්;

(iii) ඒ හේතුවෙන්, ගැබිනි මව්වරුන් අසීරුතාවයට පත්ව ඇති බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) (i) මෙම ගැටලුව විසඳීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(ii) ගල්කිරියාගම පවුල් සෞඛ්‍ය සේවා නිලධාරි වසම සඳහා මාතෘ සායන මධ්‍යස්ථානයක් ලබා දෙන දිනය කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

536/2020

ගරු රෝහණ බංඩාර මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ පිහිටි රජයට අයත් වී ගබඩා මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා පිහිටි ස්ථානවල ලිපිනයන් කවරේද;

(iii) එම එක් එක් වී ගබඩා මධ්‍යස්ථානයේ ගබඩා කළ හැකි ධාරිතාවය වෙන් වෙන් වශයෙන්කොපමණද;

(iv) 2015 වර්ෂයේ සිට මේ වනතෙක් එම එක් එක් වී ගබඩා මධ්‍යස්ථානයේ ගබඩා කරන ලද වී ප්‍රමාණය එක් එක් කන්නය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම වී ගබඩා මධ්‍යස්ථාන ජාලය, අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ තවදුරටත් ව්‍යාප්ත කිරීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

720/2020

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2016 වර්ෂයෙන් පසු විශ්‍රාම ගැන්වූ විශ්‍රාමිකයන් සඳහා 2020.01.01 දින සිට වැඩිවීමට නියමිතව තිබූ සංශෝධිත වැටුප ගෙවීම අත්හිටවා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 2020 වර්ෂය සඳහා වන අතුරු සම්මත ගිණුම මඟින් එම වැඩිවීමට නියමිතව තිබූ සංශෝධිත වැටුප ගෙවනු ලබන්නේද;

(ii) එසේ නම්, එම වැටුප ගෙවීමට බලාපොරොත්තු වන දිනය කවරේද;

(iii) 2020.01.01 දින සිට ගෙවිය යුතු හිඟ වැටුපද ඔවුනට ගෙවීමට අපේක්ෂා කරන්නේද;

(iv) එම සංශෝධිත වැටුප ලබා දිය යුතු විශ්‍රාමිකයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2021 මාර්තු 24 බදාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

47/2020

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාවේ දැනට පවතින රට බීම අළෙවිසැල් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එකී එක් එක් රට බීම අළෙවිසැල් බලපත්‍රලාභීන්ගේ නම්, ලිපිනයන්, බලපත්‍ර අංක, බලපත්‍රය පළමු වරට නිකුත් කර ඇති දිනය හෝ වර්ෂය සහ එම ව්‍යාපාර පවත්වාගෙන යන ස්ථානයේ ලිපිනයන් වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද;

(ඇ) 2000 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ වාර්ෂික රට බීම පරිභෝජනය සහ සැර ප්‍රතිශතය එක් එක් වෙළඳ නාමය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

177/2020

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාවේ ප්‍රධානතම රෝහලක් වන දකුණු කොළඹ ශික්ෂණ රෝහල් පරිශ්‍රයේ ඉදිකරමින් පවතින මහල් 13කින් සමන්විත වාට්ටු සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු ඉතා මන්දගාමීව සිදු කරනු ලබන බව එතුමිය දන්නෙහිද?

(ආ) (i) එම වාට්ටු සංකීර්ණය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය කොපමණද;

(ii) ඊට අදාළ කොන්ත්‍රාත්තුව ලබා ගත් ආයතනයේ නම කවරේද;

(iii) එම ඉදිකිරීම් කටයුතු නිම කිරීමට අපේක්ෂා කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

197/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— විදුලිබල අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදුලිබල අමාත්‍යාංශය මේ වනවිට පවත්වාගෙන යනු ලබන ස්ථානයේ ලිපිනය කවරේද;

(ii) එම අමාත්‍යාංශය පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල හිමිකරුගේ නම හා ලිපිනය කවරේද;

(iii) ගොඩනැගිල්ල සඳහා ගෙවනු ලබන මාසික කුලිය කොපමණද;

(iv) ලංකා විදුලිබල මණ්ඩලය අධික මූල්‍යමය දුෂ්කරතාවන්ට මුහුණ දී සිටින අවස්ථාවක විදුලිබල අමාත්‍යාංශය පවත්වාගන යනු ලබන ගොඩනැගිල්ල සඳහා මාසිකව අධික කුලියක් ගෙවීම සම්බන්ධයෙන් දක්වන අදහස කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

241/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂයක් තුළ —

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ ලොකු ලූනු ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය වූ මුදල කොපමණද;

(iii) එම ලොකු ලූනු ආනයනය කළ රටවල් කවරේද;

(iv) ලොකු ලූනු ආනයනය කළ සමාගම්වල නම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට ලොකු ලූනු ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

353/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුරයේ පිහිටා ඇති තිසා වැව, විවිධ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් අපිරිසිදු වී ඇති බවත්;

(ii) පානීය අවශ්‍යතා සඳහා සහ ආගමික කටයුතු සඳහා ජලය ලබා ගැනීම හේතුවෙන් අතීතයේ සිට එම වැවේ ස්නානය කිරීම, රෙදි සේදීම ආදී මානව ක්‍රියාකාරකම් තහනම් කර තිබූ බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) තිසා වැවේ ජලය පිරිසිදුව තබා ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

537/2020

ගරු රෝහණ බංඩාර මහතා,— කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින් විගමණික සේවකයන්ගේ දරුවන් සඳහා ශිෂ්‍යත්ව ලබාදීමේ වැඩසටහනක් ආරම්භ කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) එම වැඩසටහන —

(i) ආරම්භ කළ දිනය කවරේද;

(ii) ආරම්භ කිරීමේ අරමුණු කවරේද;

(iii) එමඟින් මේ දක්වා ප්‍රතිලාභ ලබා ඇති දරුවන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම වැඩසටහන නැවැත්වීමට තීරණය කර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා බලපා ඇති කරුණු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

553/2020

ගරු අශෝක් අබේසිංහ මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ පිහිටා ඇති ජාතික මාර්ග, පළාත් මාර්ග සහ ග්‍රාමීය මාර්ගවල දුර ප්‍රමාණය එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම මාර්ග අතරින්—

(i) කාපට් අතුරා ඇති මාර්ගවල දුර ප්‍රමාණය;

(ii) තාර දමා ඇති මාර්ගවල දුර ප්‍රමාණය;

(iii) තාර දමා හෝ කාපට් අතුරා නොමැති මාර්ගවල දුර ප්‍රමාණය;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත (අ) හි සඳහන් ග්‍රාමීය මාර්ග ප්‍රමාණය එක් එක් පළාත් පාලන ආයතනය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ග්‍රාමීය මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

595/2020

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) යාපනය, ඩෙල්ෆ්ට් දූපතේ පිහිටා ඇති එකම රෝහල වන ඩෙල්ෆ්ට් රෝහලේ අනුමත කාර්ය මණ්ඩල පිළිබඳ විස්තර කවරේද;

(ii) පසුගිය වර්ෂ 08ක කාලය තුළ එම රෝහලට ස්ථිර වෛද්‍යවරයෙක් පත් නොකිරීමට හේතු කවරේද;

(iii) වෛද්‍යවරයෙක් පත් නොකිරීම හේතුවෙන් ඩෙල්ෆ්ට් දූපතේ ජීවත්වන ජනතාව මුහුණදෙන දුෂ්කරතා කවරේද;

(iv) එම ජනතාවට විශිෂ්ට වෛද්‍ය සේවාවක් ලබා දීම සඳහා ඩෙල්ෆ්ට් රෝහලේ පවතින කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

609/2020

ගරු දිලිප් වෙදආරච්චි මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 1818 සහ 1819 වර්ෂවලදී සිදු වූ ඌව-වෙල්ලස්ස සටනට හම්බන්තොට ප්‍රදේශයෙන් නායකත්වය දුන් විරුවන් පිළිබඳ තොරතුරු, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ නොමැති වීම සම්බන්ධයෙන් ඔබ අමාත්‍යාංශයේ නිලධාරියෙකු විසින් සිදු කරනු ලබන පර්යේෂණයේ ප්‍රගතිය කවරේද;

(ii) එම විරුවන් රාජද්‍රෝහීන් ලෙස නම් කර ඇති බවට තොරතුරු ලැබී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම විරුවන්, ජාතික වීරවරයන් ලෙස නම් කිරීම සුදුසු බවට හම්බන්තොට දිස්ත්‍රික් ලේකම්වරයා විසින් යෝජනා කර ඇති බව එවකට ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශයේ අතිරේක ලේකම් විසින් අධිකරණ අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (නීති) වෙත යොමු කළ 2020.01.14 දිනැති ලිපියේ සඳහන් වන බව දන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

660/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය යනුවෙන් ආයතනයක් ශ්‍රී ලංකාවේ පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ආයතනය විසින් සිදු කරනු ලබන ප්‍රධාන කාර්යයන් කවරේද;

(ii) භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලය විසින් 2019 වර්ෂය තුළ නිකුත් කරඇති කැනීම් බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(iii) එම බලපත්‍ර ලබා දීම මඟින් උපයාගෙන ඇති ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2021 මාර්තු 25 බ්‍රහස්පතින්දා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

48/2020

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මේ වනවිට නිකුත් කර ඇති කැසිනෝ බලපත්‍ර සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම එක් එක් බලපත්‍රලාභීන්ගේ නම්, ලිපිනයන්, බලපත්‍ර අංකයන්, පළමුවරට බලපත්‍රය ලබා දී ඇති දිනයයන් හෝ වර්ෂයන් සහ කැසිනෝ ව්‍යාපාරයන් පවත්වාගෙන යන ස්ථානයන්ගේ ලිපිනයන් කවරේද යන්නත් වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නව කැසිනෝ බලපත්‍ර සඳහා මේ වනවිට ඉල්ලුම් කර ඇති සංඛ්‍යාව කොපමණද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

198/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලෝක වෙළඳ මධ්‍යස්ථාන ගොඩනැගිල්ල තුළ මේ වනවිට පවත්වාගෙන යනු ලබන අමාත්‍යාංශ සංඛ්‍යාව කොපමණද;

(ii) එම අමාත්‍යාංශවල නම් හා ලිපිනයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම එක් එක් අමාත්‍යාංශය පවත්වාගෙන යාම වෙනුවෙන් ගෙවනු ලබන කුලී මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) රජයේ අමාත්‍යාංශ පවත්වාගෙන යාම සඳහා ඉහළ කුලී මුදලක් ගෙවීම සම්බන්ධයෙන් රජයේ අදහස කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

300/2020

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කඩුවෙල නගරයේ පවතින අධික රථ වාහන තදබදය අවම කිරීම සඳහා යම්කිසි වැඩපිළිවෙලක් රජය විසින් යෝජනා කර තිබේද;

(ii) එසේ නම්, එම වැඩපිළිවෙල කවරේද;

(iii) එම වැඩපිළිවෙල ක්‍රියාත්මක කරනු ලබන දින වකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

354/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට පවතින දිය ඇලි සංඛ්‍යාව කොපමණද;

(ii) එම සියලු දිය ඇලි ගැසට් නිවේදන මඟින් ප්‍රකාශයට පත් කොට නීතිගත කර තිබේද;

(iii) නොඑසේ නම්, ගැසට් නිවේදන මඟින් ප්‍රකාශයට පත් කොට නීතිගත කර නොමැති දිය ඇලි සංඛ්‍යාව කොපමණද;

(iv) එම දිය ඇලි ගැසට් මඟින් ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මානව ක්‍රියාකාරකම් හේතුවෙන් සිඳී ගොස් ඇති දිය ඇලි සංඛ්‍යාව කොපමණද;

(ii) එම මානව ක්‍රියාකාරකම් කවරේද;

(iii) ඊට වගකිව යුතු පුද්ගලයන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) සිඳී ගිය දිය ඇලි නැවත සක්‍රිය කිරීමට ඇති හැකියාව පිළිබඳ සමීක්ෂණයක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, සිඳී ගිය දිය ඇලි නැවත සක්‍රිය කරනු ලබන ආකාරය කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

458/2020

ගරු ඉෂාක් රහුමාන් මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අනුරාධපුර සිට කුරුණෑගල නගරයට ළඟාවිය හැකි කෙටිම මාර්ගය බුල්නෑව - පොල්පිතිගම මාර්ගය බවත්;

(ii) එම මාර්ගයේ තලාව හංදියේ සිට පොල්පිතිගම හංදිය දක්වා වූ කොටස මේ වනවිට අබලන් තත්ත්වයේ පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම මාර්ග කොටස සංවර්ධනය කිරීමට අපේක්ෂා කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගෙන ඇති පියවර කවරේද;

(iii) එම සංවර්ධන කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

538/2020

ගරු රෝහණ බංඩාර මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ පාසල් සිසුන් ප්‍රවාහනය කිරීමේ "සිසුසැරිය" වැඩසටහන ආරම්භ කිරීමට පියවර ගෙන තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එසේ නම්, ඒ සඳහා යොදවා ඇති බස්රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම වැඩසටහන අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ ව්‍යාප්ත කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

601/2020

ගරු උදයන කිරිඳිගොඩ මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මධ්‍යම අධිවේගී මාර්ග —

(i) ව්‍යාපෘතියේ වර්තමාන ප්‍රගතිය කවරේද;

(ii) ව්‍යාපෘතියට මේ වනවිට වැය කර ඇති මුදල කොපමණද;

(iii) ව්‍යාපෘතිය අවසන් කිරීමට වැය කළ යුතු ඉතිරි මුදල කොපමණද;

(iv) ව්‍යාපෘතිය අවසන් කිරීමට යෝජිතව තිබූ දිනය කවරේද;

(v) ව්‍යාපෘතියට අදාළව පසුගිය රජය සමයේ සිදුවූ අක්‍රමිකතා/ප්‍රමාදයන් හේතුවෙන් එය අවසන් කළ හැකි යැයි අනුමාන කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු —

(i) භාර දී ඇති සමාගම් කවරේද;

(ii) ප්‍රමාද කොට ඇති සමාගම්වලට එහි ඉදිකිරීම් කටයුතු නැවත පවරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම ව්‍යාපෘතියේ මහනුවර නගරයට ආසන්න අවසන් පිවිසුම ඇති ප්‍රදේශය කවරේද;

(ii) මහනුවර සිට ගලගෙදර දක්වා වූ මාර්ගයේ පවතින දැඩි වාහන තදබදය හේතුවෙන් ඒ ඔස්සේ අධිවේගී මාර්ගයට පිවිසීමට විනාඩි 30 - 45 අතර කාලයක් ගත වන බැවින් මහනුවර ප්‍රදේශයේ ජනතාවට පහසුවෙන් අධිවේගී මාර්ගයට ප්‍රවිෂ්ට වීමට පිවිසුම් මාර්ග සකස් කරන්නේද;

(iii) එසේ නම්, එම අධිවේගී පිවිසුම් ඉදිකරනු ලබන ප්‍රදේශ කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

661/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අලව්ව නගරය සංවර්ධන සැලැස්මකට අනුව ක්‍රමවත්ව සංවර්ධනය කළ යුතු බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) අලව්ව නගරයට නගර සංවර්ධන සැලසුමක් සකස් කර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා අවශ්‍ය වන මුදල් ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

(iii) එම ප්‍රතිපාදන වෙන් කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

670/2020

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ඉදිකරමින් පවතින පහළ උමා ඔය වාරි ව්‍යාපෘතිය මගින් ඉදිකරනු ලබන වැව් හා ඇළමාර්ග සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ව්‍යාපෘතිය මගින් පෝෂණය වන වැව් සංඛ්‍යාව කොපමණද;

(iii) එම ව්‍යාපෘතිය මගින් අස්වද්දනු ලැබිය හැකි ගොඩ හා මඩ ඉඩම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ව්‍යාපෘතිය ඉදිකිරීම සඳහා වැය වන මුදල කොපමණද;

(v) එම මුදල සපයා ගත් අරමුදල් ප්‍රභවයන් කවරේද;

(vi) එම ව්‍යාපෘතිය අවසන් කිරීමට අපේක්ෂා කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

870/2020

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පිහිටා ඇති ජාතික පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල්වල මේ වනවිට සේවයේ නියුතු විදුහල්පතිවරුන්ගේ අධ්‍යාපන සුදුසුකම් සහ ඔවුන් අදාළ පාසල්වල විදුහල්පතිවරුන් ලෙස සේවය කරනු ලබන කාලය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පිහිටා ඇති ජාතික පාසල් සඳහා නිසි සුදුසුකම් සහිත විදුහල්පතිවරුන් පත් කිරීමට අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2021 මාර්තු 26 සිකුරාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

67/2020

ගරු හේෂා විතානගේ මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව අපද්‍රව්‍ය කළමණාකරණය යන විෂයය, පළාත් සභා යටතට ගැනෙන විෂයයක් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, පළාත් සභා ක්‍රමය ආරම්භයේ සිට මේ වනතෙක් සන අපද්‍රව්‍ය කළමණාකරණය සඳහා වෙනම ආයතන ස්ථාපිත කර ඇති පළාත් සභාවල නම් කවරේද;

(ii) එවැනි විශේෂිත ආයතනයක් ස්ථාපනය කර නොමැති පළාත් සභාවල නම් කවරේද;

(iii) එවැනි ආයතනයක් ස්ථාපනය කර නොමැති පළාත් සභා සඳහා සුවිශේෂී ආයතනයක් ස්ථාපනය කිරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්,ඒ මන්ද?

199/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට පවතින කැබිනට් අමාත්‍යාංශ සංඛ්‍යාව සහ රාජ්‍ය අමාත්‍යාංශ සංඛ්‍යාව;

(ii) ඒවායේ නම්;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඒ අතරින් පෞද්ගලික ගොඩනැගිලිවල අමාත්‍යාංශ පවත්වාගෙන යනු ලබන කැබිනට් අමාත්‍යාංශ හා රාජ්‍ය අමාත්‍යාංශ සංඛ්‍යාව;

(ii) ඒවායේ නම් ;

(iii) ඒ සඳහා ගෙවනු ලබන මාසික කුලී මුදල;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පෞද්ගලික ගොඩනැගිලිවල පවත්වාගෙන යනු ලබන අමාත්‍යාංශ රජයේ ගොඩනැගිලි වෙත ගෙන යාම සඳහා ගනු ලබන පියවර කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

242/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂයක් තුළ—

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ වාහන අමතර කොටස් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය වූ මුදල කොපමණද;

(iii) එම වාහන අමතර කොටස් ආනයනය කළ රටවල් කවරේද;

(iv) එකී වාහන අමතර කොටස් ආනයනය කළ සමාගම්වල නම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට වාහන අමතර කොටස් ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා වෙන් වෙන් වශයෙන් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

355/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පානීය ජලය සපයන අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති වැව්වල ජලයේ ගුණාත්මකභාවය පිරිහී ඇති බවත්;

(ii) E-coli ඇතුළු විෂබීජ අඩංගු වීම හේතුවෙන් එම ජලය ජනතාවගේ සෞඛ්‍යයට අහිතකර බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) පානීය ජලය ලබා ගැනීම සඳහා භාවිතා කරනු ලබන අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති වැව්වල නම් කවරේද;

(ii) එම වැව්වල ජලයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමට ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(iii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

519/2020

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වාලච්චේන ධීවර වරාය තුළ සාමාන්‍ය ට්‍රෝලර් යාත්‍රා හැසිරවිය හැකි වුවත්, විශාල ප්‍රමාණයේ ට්‍රෝලර් යාත්‍රා හැසිරවීම සඳහා එහි පිවිසුම සහ ගැඹුර ප්‍රමාණවත් නොවීම හේතුවෙන් දේශීය ධීවරයින් ගැටලු රැසකට මුහුණ දී ඇති බවත්;

(ii) එම ධීවර වරාය පුළුල් කිරීමේ අවශ්‍යතාවයක් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එම ධීවර වරාය පුළුල් කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

543/2020

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වර්ෂ 2015 සිට 2018 දක්වා වූ කාලය තුළ ශ්‍රී ලංකාවේ ජාතික පාසල්වල අනධ්‍යයන කාර්ය මණ්ඩල සඳහා සේවකයන් බඳවා ගත් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එක් එක් ජාතික පාසල සඳහා එසේ බඳවාගත් තනතුරු නාමයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එක් එක් ජාතික පාසල සඳහා එසේ බඳවාගත් සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

671/2020

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මෑතකදී ඉදිකිරීම් ආරම්භ කරන ලද බිංගිරිය කිණියම වාරි ව්‍යාපෘතියේ යෝජිත ඉදිරි වැඩ කොටස් සඳහා වැය වන මුදල් සපයා ගනු ලබන ආකාරය කවරේද;

(ii) එම යෝජිත ඉදිරි වැඩ කොටස් සඳහා වැය වන මුදල කොපමණද;

(iii) එම යෝජිත ඉදිරි වැඩ කොටස් සඳහා ගත වන කාලය කොපමණද;

(iv) මෙම ව්‍යාපෘතිය මඟින් පෝෂණය වන වැව් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

757/2020

ගරු අමරකීර්ති අතුකෝරළ මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ —

(i) වන අලින්ගේ සංචරණ ක්‍රියාවලිය සම්බන්ධයෙන් අධ්‍යයනයක් සිදු කර තිබේද;

(ii) වන අලින් වැඩි වශයෙන් සංචරණය කරන ජාතික වනෝද්‍යාන හා රක්ෂිත වනාන්තර වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) අලි කොරිඩෝ තිබේ නම්, ඒවා පිහිටි ස්ථාන කවරේද;

(iv) අලි කොරිඩෝ හරස්වන ආකාරයට ගම්මාන හෝ ජනතාව පදිංචි ස්ථාන තිබේ නම්, ඒවා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) වර්ෂ 2015 සිට 2020 සැප්තැම්බර් දක්වා දිස්ත්‍රික්කයේ අලි මිනිස් ගැටුමෙන් —

(i) මියගිය පුද්ගලයන් හා වන අලින් සංඛ්‍යාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව;

(ii) හානි වී ඇති නිවාස සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව;

(iii) මියගිය හා දේපළ අහිමිවූවන්ට ගෙවා ඇති වන්දි මුදල එක් එක් පුද්ගලයා අනුව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) දිස්ත්‍රික්කයේ අලි-මිනිස් ගැටුම පාලනය කිරීමට ගත් නව ක්‍රියාමාර්ග කවරේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

803/2020

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කිළිනොච්චි දිස්ත්‍රික්කයේ කරච්චි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කිළි / වට්ටක්කච්චි මධ්‍ය මහා විද්‍යාලය නමින් පාසලක් පිහිටා ඇති බවත්;

(ii) එම පාසල සඳහා නව ශ්‍රවණාගාරයක් ඉදිකිරීමට 2017 වර්ෂයේදී මුල්ගල තැබූ බවත්;

(iii) වෙන් කරන ලද ප්‍රතිපාදන, මුදා නොහැරීම හේතුවෙන් ශ්‍රවණාගාරය ඉදිකිරීම මේ වනවිට නවතා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ශ්‍රවණාගාරය ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කරන ලද අමාත්‍යාංශය කවරේද;

(ii) එම ප්‍රතිපාදන, මුදා නොහැරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් ශ්‍රවණාගාරය සම්පූර්ණයෙන්ම ඉදිකර අවසන් කිරීම සඳහා අවශ්‍ය මුදල කොපමණද;

(ii) ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කරනු ලබන දිනය කවරේද;

(iii) එහි ඉදිකිරීම් සම්පූර්ණ කර සිසුන්ගේ භාවිතය සඳහා ලබා දීමට ගත වන කාලය කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

871/2020

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පිහිටා ඇති ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් ඩිපෝ සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඩිපෝවල නම් කවරේද;

(iii) එම එක් එක් ඩිපෝව සතු මේ වනවිට ධාවනයේ යෙදවීමට සුදුසු තත්ත්වයේ පවතින බස්රථ සංඛ්‍යාව කොපමණද ;

(iv) එම එක් එක් ඩිපෝවේ මේ වනවිට පවතින සේවක පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද ;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පිහිටා ඇති ඩිපෝවල සේවය කරනු ලබන මානව සම්පත සංවර්ධනය කිරීම සඳහා හා එම ඩිපෝවල පවතින බස්රථ ඇණි වැඩි දියුණු කිරීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

**2021 අප්‍රේල් 06 අඟහරුවාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

26/2020

ගරු හේෂා විතානගේ මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රැකියා විරහිත උපාධිධාරීන් සම්මුඛ පරීක්ෂණයක් මඟින් රජයේ ආයතනවල අභ්‍යාසලාභී පුහුණුව සඳහා බඳවාගැනීමට 2020 වර්ෂයේදී ප්‍රසිද්ධ කරන ලද පුවත්පත් දැන්වීමකට අනුව, ඒ සඳහා අයදුම්පත් යොමු කළ උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සම්මුඛ පරීක්ෂණ සඳහා පෙනී සිටි උපාධිධාරීන් සංඛ්‍යාව, එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) සම්මුඛ පරීක්ෂණයෙන් පසුව පුහුණුව සඳහා බඳවාගන්නා ලද උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අදාළ පුහුණුව සඳහා බඳවාගැනීමේදී මෙම උපාධිධාරීන් බාහිර හා අභ්‍යන්තර උපාධිධාරීන් වශයෙන් වර්ගීකරණයක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, බඳවාගත් බාහිර උපාධිධාරීන් සංඛ්‍යාව සහ අභ්‍යන්තර උපාධිධාරීන් සංඛ්‍යාව, එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) බාහිර උපාධිධාරීන් සඳහා පත්වීම් ලිපි ලබා දීමේදී ගැටලුකාරී තත්ත්වයක් උද්ගත වීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

66/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) 2015 වර්ෂයේ සිට මේ වන තෙක් දුම්රිය ප්‍රවාහනයට එකතු කරන ලද දුම්රිය මැදිරි සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම එක් එක් දුම්රිය මැදිරි අතරින් දේශීයව නිෂ්පාදන කරන ලද දුම්රිය මැදිරි සංඛ්‍යාව හා විදේශීය රටවලින් ආනයනය කරන ලද දුම්රිය මැදිරි සංඛ්‍යාව;

(ii) ඒ සඳහා වැය කරන ලද මුදල;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) අප රට තුළ දුම්රිය මැදිරි නිෂ්පාදනය කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්න එතුමා තවදුරටත් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

108/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ශ්‍රී ලංකාවේ දරුවන් සඳහා ලබා දෙන ත්‍රිපෝෂ පෝෂණ අතිරේකය ප්‍රමාණවත් හා විධිමත් පරිදි නොලැබෙන බවත්;

(ii) ළමා මන්දපෝෂණය සැලකිය යුතු මට්ටමක පැවතීමට මෙම තත්ත්වයද එක් හේතුවක් බවත්;

(iii) ඒ හේතුවෙන්, දරුවන් සිටින අඩු ආදායම්ලාභී පවුල් දැඩි අපහසුතාවයට පත්වන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) දැනට වාර්ෂික ත්‍රිපෝෂ නිෂ්පාදන ධාරිතාවය කිලෝග්‍රෑම් කොපමණද;

(ii) පරිභෝජනය සඳහා වර්ෂයකට අවශ්‍ය ත්‍රිපෝෂ කිලෝග්‍රෑම් ප්‍රමාණය කොපමණද යන්න ගණනය කර තිබේද;

(iii) එසේ නම්, එම ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) රටේ අවශ්‍යතාවයට ප්‍රමාණවත් පරිදි ත්‍රිපෝෂ නිෂ්පාදනයට පියවර ගන්නේද;

(ii) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

169/2020

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ඉඩම් ඔප්පු හිමිකම් නොමැති නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිවාස සඳහා ඔප්පු ලබා දීමේ වැඩපිළිවෙළක් තිබේද;

(iii) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

227/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— වැවිලි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂයක් තුළ—

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ බඩ ඉරිඟු ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය වූ මුදල කොපමණද;

(iii) එම බඩ ඉරිඟු ආනයනය කළ රටවල් කවරේද;

(iv) එම බඩ ඉරිඟු ආනයනය කළ සමාගම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට බඩ ඉරිඟු ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

419/2020

ගරු වරුණ ලියනගේ මහතා,— වැවිලි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ වතු ආශ්‍රිතව ජීවත්වන පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ට නිවාස තනා ගැනීම සඳහා ඉඩම් ලබා දී තිබේද;

(iii) එසේ නම්, ඉඩම් ලබා දී ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පවුල්වලට ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(v) එසේ ඉඩම් ලබා දී ඇති පවුල්, අයත්වන වතු සමාගම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉඩම් නොමැති වතු ආශ්‍රිතව ජීවත් වන පවුල් සඳහා ඉඩම් ලබාදීමට රජය ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

451/2020

ගරු ඉෂාක් රහුමාන් මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මොරගහකන්ද-කළු ගඟ සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භ කර උතුරු මැද පළාතට ජලය ලබාදීමේ පියවරක් වශයෙන් මේ වනවිට පොළොන්නරුව දිස්ත්‍රික්කයට ජලය ලබාදී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) ඉහත ව්‍යාපෘතිය යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයට ජලය ලබාදීම සඳහා ක්‍රියාමාර්ග ආරම්භ කර තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම යෝජනා ක්‍රම මඟින් හුරුළුවැවට හා කණදරාවැවට ජලය ලබාදීමේ යෝජනාවක් තිබේද;

(ii) එසේ නම්, එම යෝජනාව ක්‍රියාත්මක කරනු ලබන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

483/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය විසින් ශ්‍රී ලංකාවේ වගා බිම්වල පළිබෝධ නාශක, වල් නාශක සහ පොහොර භාවිතය පිළිබඳ පර්යේෂණයක් සිදු කර තිබෙන බවත්;

(ii) පළිබෝධ නාශක, වල් නාශක සහ පොහොර භාවිතා කර වගා කරන රටවල් අතරින් ශ්‍රී ලංකාව ඉදිරියෙන් සිටින රටක් බවට පත්ව තිබෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) පළිබෝධ නාශක, වල් නාශක සහ පොහොර භාවිතා කර වගා කටයුතු සිදුකිරීම අවම කිරීමට අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

544/2020

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නායයාමේ අවදානම් සහිත දිස්ත්‍රික්ක තුළ ගොඩනැගිලි ඉදිකිරීමේදී ඊට අවසර ලබාගත යුතු ආයතන කවරේද;

(ii) එම ආයතන මඟින් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා අවසර ලබා දෙන ක්‍රමවේද කවරේද;

(iii) එම ක්‍රමවේද අනුවම ගොඩනැගිලි ඉදිකිරීම සඳහා අවසර ලබාදීම සිදුවන්නේද;

(iv) නොඑසේ නම්, ඒ සඳහා ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නායයාමේ අවදානම් නොමැති දිස්ත්‍රික්ක තුළ ගොඩනැගිලි ඉදිකිරීමේදී අදාළ පළාත් පාලන ආයතනවලින් පමණක් අනුමතිය ලබාදෙන බව එතුමා දන්නෙහිද;

(ii) එම දිස්ත්‍රික්ක තුළ ගොඩනැගිලි ඉදිකිරීමේදී ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයෙන් සහ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙන් අධීක්ෂණයක් සිදුවන්නේද;

(iii) අධීක්ෂණයක් සිදු වන්නේ නම්, ගොඩනැගිලි වර්ග කිරීමක් කර අනුමතිය ලබා දෙන්නේද;

(iv) නොඑසේ නම්, ඉදිරියේදී එවැනි වැඩපිළිවෙළක් සකස් කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

556/2020

ගරු අශෝක් අබේසිංහ මහතා,— ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කළ ප්‍රධාන ජල යෝජනා ක්‍රම සංඛ්‍යාව කොපමණද;

(ii) එම යෝජනා ක්‍රම මඟින් ආවරණය වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සංඛ්‍යාව කොපමණද;

(iii) එමඟින් ආවරණය වන ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල සහ ග්‍රාම නිලධාරි වසම්වල නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) එම ජල යෝජනා ක්‍රම සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය එක් එක් යෝජනා ක්‍රමය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) එම ජල යෝජනා ක්‍රම අවසන් කිරීමට නියමිත කාල සීමාව එක් එක් යෝජනා ක්‍රමය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑස් නම් ඒ මන්ද?

---

**2021 අප්‍රේල් 07 බදාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

27/2020

ගරු හේෂා විතානගේ මහතා,— සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මත්තල ජාත්‍යන්තර ගුවන්තොටුපොළ ඉදිකිරීම් සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(ii) එම මුදල් සපයාගත් මූලාශ්‍ර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මත්තල ජාත්‍යන්තර ගුවන්තොටුපොළ විවෘත කළ දින සිට මේ දක්වා—

(i) ලැබූ ආදායම;

(ii) නඩත්තු කටයුතු වෙනුවෙන් දරන ලද වියදම;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම ගුවන්තොටුපොළ විවෘත කළ දින සිට මෙතෙක් එහි පැමිණි ගුවන් යානා සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගුවන් යානා අයත් වන ගුවන් සේවා ආයතන කවරේද;

(iii) එම කාලසීමාව තුළ මෙම ගුවන්තොටුපොළ හරහා ගමන් ගත් මගීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) මෙම ගුවන්තොටුපොළ තවදුරටත් සංවර්ධනය සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

130/2020

ගරු වමින්ද විජේසිරි මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට ක්‍රියාත්මක වන මහ නගර සභා සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) එම මහ නගර සභා අතරින් කසළ ඉවත් කිරීම පෞද්ගලික ආයතන වෙත භාර දී ඇති මහ නගර සභා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මහ නගර සභාවල කසළ ඉවත් කිරීම භාරගත් පෞද්ගලික සමාගම් කවරේද;

(ii) 2015 වර්ෂයේ සිට මේ දක්වා ඉහත සමාගම් වෙත ගෙවා ඇති මුදල කොපමණද;

යන්නත් වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) එම පළාත් පාලන ආයතනවල සේවකයන් යොදවා සිය පළාත් පාලන බලප්‍රදේශයේ කසළ ඉවත් කරවීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්න වැඩිදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

191/2020

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) කිළිනොච්චි නගර මධ්‍යයේ පිහිටා ඇති පොදු ක්‍රීඩාංගණය, ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩාංගණයක් ලෙස සංවර්ධනය කිරීමට 2010 වර්ෂයේදී ඉදිකිරීම් කටයුතු ආරම්භ කර මේ වනවිට දස වසරක් ගත වී තිබුණ ද, එම ක්‍රීඩාංගණය දිස්ත්‍රික්කයේ ක්‍රීඩකයන්ගේ ප්‍රයෝජනය සඳහා මේ දක්වා භාර දී නොමැති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ක්‍රීඩාංගණය, ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩාංගණයක්ද; නොඑසේ නම්, දිස්ත්‍රික් මට්ටමේ ක්‍රීඩාංගණයක්ද;

(ii) ක්‍රීඩාංගණයේ ඉදිකිරීම් කටයුතු සඳහා වෙන් කරන ලද මුදල කොපමණද;

(iii) ඉහත මුදලින් පසුගිය වර්ෂ 10 තුළදී වැය කර ඇති මුදල කොපමණද;

(iv) ක්‍රීඩාංගණයේ ඉදිකිරීම් වෙනුවෙන් කොන්ත්‍රාත් අත්සන් කර ඇති කොන්ත්‍රාත්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(v) කොන්ත්‍රාත් කටයුතු සිදු කරන වර්තමාන කොන්ත්‍රාත්කරුගේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම ක්‍රීඩාංගණයේ ප්‍රතිසංස්කරණ කටයුතුවල ප්‍රමාදය, දිස්ත්‍රික්කයේ ක්‍රීඩකයන්ගේ ක්‍රීඩා කටයුතුවලට කෙතරම් දුරට බලපා තිබේද;

(ii) දිස්ත්‍රික්කයේ ක්‍රීඩා කටයුතු නංවාලීමට අමාත්‍යාංශය විසින් ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

229/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂයක් තුළ—

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ කිරි පිටි ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය වූ මුදල කොපමණද;

(iii) එම කිරි පිටි ආනයනය කළ රටවල්වල් කවරේද;

(iv) එම කිරි පිටි ආනයනය කළ සමාගම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට කිරි පිටි ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

266/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කැළණිවැලි දුම්රිය මාර්ගය දෙපස ඇති මාර්ග රක්‍ෂිතය තුළ පදිංචිව සිටින්නන් පිළිබඳව සංගණනයක් කර තිබේද;

(ii) එසේ නම්, එම පවුල් ඒකක සංඛ්‍යාව කොපමණද;

(iii) මාර්ග රක්‍ෂිතයෙන් එම පවුල් ඒකක ඉවත් කර වෙනත් ස්ථානයක පදිංචි කරවීමට සැලසුමක් තිබේද;

(iv) එසේ නම්, ඔවුන් පදිංචි කරවීමට අපේක්‍ෂා කරන ප්‍රදේශය කවරේද;

(v) ඒ සඳහා වැය කරන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

485/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වී අළෙවි මණ්ඩලය ස්ථාපිත කළ දිනය කවරේද;

(ii) එය ස්ථාපිත කිරීමේ අරමුණු කවරේද;

(iii) 2015 වර්ෂයේ සිට මේ වනතෙක් වී අළෙවි මණ්ඩලය විසින් එක් එක් කන්නයේ මිලදී ගත් වී ප්‍රමාණය කොපමණද;

(iv) පෞද්ගලික අංශයේ වෙළඳුන් විසින් ගොවීන්ගෙන් අඩු මිලට වී මිලදී ගැනීම වැළැක්වීම සඳහා වී අළෙවි මණ්ඩලය ශක්තිමත් කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

610/2020

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) කුලියාපිටිය මූලික රෝහල, ශික්ෂණ රෝහලක් බවට පත් කර ඇති බව එතුමිය දන්නෙහිද?

(ආ) (i) එම රෝහල ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ, වෛද්‍ය පීඨයේ සායනික පුහුණුවීම් සඳහා යොදාගැනීමට කටයුතු කරන්නේද;

(ii) මේ සම්බන්ධව කරුණු අධ්‍යයනය කිරීම සඳහා ත්‍රිපුද්ගල කමිටුවක් පත්කර ඇති බව දන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය හා කුලියාපිටිය ශික්ෂණ රෝහල සම්බන්ධව මහාචාර්ය ඒකකයක් පිහිටුවා තිබේද;

(ii) එම ඒකකය කුලියාපිටිය රෝහලේ ස්ථාපනය කිරීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1352/2020

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පෙර පැවති අළුත්ගම සහ දර්ගා නගරය යන සුළු නගර සභා බලප්‍රදේශවලට අයත් ප්‍රදේශ, මුහුදු මට්ටමට වඩා පහතින් පිහිටා තිබීම හේතුවෙන් නිතර නිතර ජල ගැලීම්වලට ලක් වූ බවත්;

(ii) ඒ හේතුවෙන් එම ප්‍රදේශවල ජීවත්වන ජනතාවට සහ ඔවුන්ගේ දේපළවලට සිදු වන හානිය වැළැක්වීමේ අරමුණින් 1993 වර්ෂයේදී ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ එම ප්‍රදේශ සඳහා මතුපිට කානු පද්ධතියක් සකස් කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කරන ලද බවත්;

(iii) එම ව්‍යාපෘතියේ පළමු අදියර අළුත්ගම ප්‍රදේශය ආවරණය වන පරිදි ක්‍රියාත්මක කරන ලද නමුත්, එහි දෙවන අදියර මේ වනතෙක් ක්‍රියාත්මක නොවීම හේතුවෙන් එම ප්‍රදේශවල ජීවත්වන ජනතාව තවදුරටත් පීඩාවට පත් වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත ව්‍යාපෘතියේ දෙවන අදියර ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා වන වැඩපිළිවෙළ කවරේද;

(iii) එම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීම ආරම්භ කරනු ලබන දින වකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2021 අප්‍රේල් 08 බ්‍රහස්පතින්දා
# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

68/2020

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) නිවසක් ඉදිකර ගැනීම සඳහා ඉඩමක් නොමැති පවුල් 6579ක් රත්නපුර දිස්ත්‍රික්කයේ සිටින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් පවුල් සඳහා නිවාස ඉදිකිරීමට අවශ්‍ය වන ඉඩම් ප්‍රමාණය රාජ්‍ය වතු සමාගම් සන්තකයේ ඇති ඉඩම්වලින් ලබා ගැනීමට රජය කටයුතු කරන්නේද;

(ii) නොඑසේ නම්, මේ සම්බන්ධයෙන් රජය විසින් ගැනීමට අපේක්ෂිත විකල්ප ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

135/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— විදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදේශ රටවල්වල පිහිටි ශ්‍රී ලංකාවේ විදේශ ගත රාජ්‍ය දූත මණ්ඩල සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් දූත මණ්ඩල පිහිටි රටවල් හා නගර වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම එක් එක් දූත මණ්ඩලයේ සේවය කරන සේවක සංඛ්‍යාව සහ තනතුරු නාම වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම සේවකයන් අතරින් සෘජුවම ශ්‍රී ලංකා විදේශ සේවයට බඳවාගැනීමේ විභාගයෙන් සමත් වූ නිලධාරීන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(v) ශ්‍රී ලංකා විදේශ සේවයට සෘජුවම අයත් වන සේවක සංඛ්‍යාව, විදේශ දූත මණ්ඩලවල සේවය කරන සමස්ත සේවක සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස කවරේද;

(vi) විදේශ දූත මණ්ඩලවල සේවය සඳහා ශ්‍රී ලංකා විදේශ සේවයට අයත් නිලධාරීන් වැඩි වශයෙන් බඳවා ගැනීමට අමාත්‍යාංශය ඉදිරියේදී ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

267/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොත්මලේ පිහිටි වාරිමාර්ග හා ජල කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු ආයතනයෙහි පුහුණුව ලද ඉංජිනේරු සහකාර දෙවැනි කණ්ඩායමේ අභ්‍යාසලාභීන් 71 දෙනෙකු මේ වනතෙක් ස්ථිර සේවයට බඳවාගෙන නොමැති බවත්;

(ii) මේ වනවිට ඔවුන්ගේ පුහුණුව අවසන් වී වර්ෂයකට වඩා වැඩි කාලයක් ගත වී ඇති බවත්;

(iii) ප්‍රාදේශීය කාර්යාලවලට අනුයුක්තව සේවය කළ ද, ඔවුන්ට නිසි වැටුප් ගෙවීමක් සිදු නොකරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම අභ්‍යාසලාභීන් ස්ථිර සේවයට බඳවා ගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

301/2020

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 මැයි මාසයේදී කැළණි ගඟ පිටාර ගැලීමෙන් කොළඹ දිස්ත්‍රික්කයට බලපාන ලද ගංවතුර හේතුවෙන් පීඩාවට පත් ජනතාව සඳහා ගෙවන ලද වන්දි මුදල;

(ii) කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පදිංචිව සිටින ඉහත ගංවතුර හේතුවෙන් පීඩාවට පත් වූ එහෙත් අදාළ වන්දි මුදල් නොලැබුණු පවුල් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද අභියාචනා සලකා බලා රු. 20,000/- බැගින් වන්දි ගෙවීමට අමාත්‍ය මණ්ඩල අනුමතිය ලැබී ඇති බව එතුමා දන්නෙහිද;

(ii) එසේ නම්, එම වන්දි මුදල් ගෙවනු ලබන ක්‍රමවේදය කවරේද;

(iii) එම වන්දි මුදල් ගෙවනු ලබන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

434/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (3)

(අ) ඩෙංගු රෝගය විවිධ අවස්ථාවලදී ශ්‍රී ලංකාව තුළ වර්ධනය වන බව එතුමිය පිළිගන්නෙහිද?

(ආ) (i) 2019 වසර තුළ ඩෙංගු රෝගය හේතුවෙන් අහිමි වූ ජීවිත සංඛ්‍යාව කොපමණද;

(ii) ඩෙංගු රෝගය මර්දනය සඳහා ජාතික හා ප්‍රාදේශීය වශයෙන් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද;

(iii) ප්‍රාදේශීය ඩෙංගු මර්දන වැඩපිළිවෙළ සඳහා බඳවාගත් කම්කරුවන් පිරිසක් සිටින බව පිළිගන්නේද;

(iv) එසේ නම්, ඔවුන්ගේ සේවය අඛණ්ඩව ලබා ගැනීමට සැලැස්මක් තිබේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

453/2020

ගරු ඉෂාක් රහුමාන් මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, කහටගස්දිගිලිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 215 දිවුල්වැව ග්‍රාම නිලධාරි වසමේ, බඹරඇළ ග්‍රාමයේ 1973 වර්ෂයේ සිට හේන් ගොවිතැන් කරන ලද ගොවීන්ගේ සින්නක්කර ඔප්පු සහිත ඉඩම්වලට වනජීවී නිලධාරින් පැමිණ රක්ෂිත මායිම් සළකුණු කර මායිම් කණු දමා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, මේ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

547/2020

ගරු චන්දිම වීරක්කොඩි මහතා,— ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) හබරාදූව, අක්මීමන, ගාල්ල සහ රත්ගම යන ප්‍රදේශවලට දැඩි පානීය ජල ගැටලුවක් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එකී ප්‍රශ්නයට විසඳුම වන මාගාල්ල ජල යෝජනා ක්‍රමයේ ඊළඟ අදියර සඳහා ඉදිරි අයවැය ලේඛනයෙන් මුදල් වෙන් කරන්නේද;

(ii) එසේ නම්, එම මුදල කොපමණද;

(iii) ඉහත කී ප්‍රදේශවල පවතින පානීය ජල ගැටලුව සඳහා විසඳුමක් ලබා දෙන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

558/2020

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් දේවහුව ග්‍රාම නිලධාරි වසම තුළ පිහිටි ගල්බොක්කයාය නම් ගමෙහි, ගලේවෙල-කලා වැව පාරේ, බුලන් වැව ගල් කොරියට හා ප්‍රධාන මාර්ගයට යාබදව ඇති භූමිය, රක්ෂිතයක් බැවින් එය වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් වන බවත්;

(ii) 2020.09.22 වන දින අලුයම් කාලයේදී සංවිධානාත්මක පිරිසක් විසින් ඉහත භූමිය තුළ ස්ථිර ගොඩනැගිල්ලක් හා තාවකාලික ඉදිකිරීම් කීපයක් සිදුකර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ඉදිකිරීම් සඳහා අදාළ ප්‍රාදේශීය ලේකම්වරයාගේ අනුමතිය ලැබී තිබේද;

(ii) නොඑසේ නම්, වෙනත් වගකිව යුතු රාජ්‍ය නිලධාරියකු හෝ ආයතනයක අනුමතිය ලැබී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) නොඑසේ නම්, මෙම ඉදිකිරීම් ඉවත් කර රක්ෂිතය ආරක්ෂා කර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

577/2020

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් මහවැලි "එල්" කලාපය සඳහා මුලතිව් හා වවුනියා දිස්ත්‍රික්කවලින් අත්පත් කර ගත් ඉඩම් ප්‍රමාණය කොපමණද යන්න හෙක්ටයාර්වලින් හා ප්‍රතිශතයක් ලෙස එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 1984 වර්ෂයේදී බලහත්කාරයෙන් ඉවත් කරන ලද මුලතිව් දිස්ත්‍රික්කයේ කෝකිලායි, කොක්කුත්තොඩුවායි, කර්නාට්ටුක්කේණි ගම්මානවල ජීවත් වූ, දෙමළ ජනතාව, යුද්ධයෙන් පසු එම ගම්මාන වෙත පදිංචියට ගිය විට ඔවුන්ගේ ඉඩම්වල සිංහල ජනතාව පදිංචිව සිටි බවත්;

(ii) දෙමළ නම්වලින් හැඳින්වූ ගම්මාන හා වැව් සඳහා සිංහල නම් යොදා තිබූ බවත්;

(iii) දෙමළ ජනතාවගේ බලපත්‍ර සහිත ඉඩම්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් දේශපාලඥයන්ගේ ඥාතීන් හා ධනවතුන්ට දීර්ඝ කාලීන බද්දට ලබාදී තිබූ බවත්;

(iv) ඉහත ගම්මානවල ජනතාව සිය ඉඩම්වල ගොවිතැන් කිරීමේදී, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් බාධා කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) මුලතිව් දිස්ත්‍රික්කයේ මහවැලි "එල්" කලාපයට අයත් සිංහල ජනතාව පදිංචි ඉඩම් හැර ඉතිරි ඉඩම්, මුහුදුබඩපත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය කොට්ඨාසය වෙත පවරන්නේද;

(ii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

581/2020

ගරු වේලු කුමාර් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) තෙල්දෙණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටා ඇති මාබේරිතැන්න රජයේ සත්ව ගොවිපොළ, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය (NLDB) විසින් පාලනය කරනු ලබන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ගොවිපොළෙහි සේවය කරනු ලබන කාර්යාලීය නිලධාරින් සංඛ්‍යාව සහ කම්කරුවන් සංඛ්‍යාව;

(ii) පදිංචි වී සිටින පවුල් සංඛ්‍යාව;

(iii) පිහිටා ඇති කම්කරු ජනාවාස හා ලයින් සංඛ්‍යාව;

(iv) පිහිටා ඇති මුළු ලයින් කාමර සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් ගොවිපොළෙහි, ලයින් කාමරවල පදිංචි වී සිටින පවුල් සඳහා තනි නිවාස ඉදිකිරීමට පසුගිය කාලයේදී ඉඩම් ලබා දුන් බව එතුමා දන්නෙහිද;

(ii) එසේ නම්, ලබා දෙන ලද ඉඩම් කැබලි සංඛ්‍යාව කොපමණද;

(iii) එම ගොවිපොළෙහි පදිංචි වී සිටින එහෙත් ලයින් කාමරවල පදිංචි වී නොසිටින පවුල් සඳහා ඉඩම් ලබා දීමට කටයුතු කරන්නේද;

(iv) නොඑසේ නම්, එයට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

**2021 අප්‍රේල් 09 සිකුරාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

69/2020

ගරු හේෂා විතානගේ මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති අත් යන්ත්‍ර පේෂකර්ම මධ්‍යස්ථාන මඟින් විශාල රැකියා සංඛ්‍යාවක් බිහි කරමින් ජාතික නිෂ්පාදනයට සෘජු හා වක්‍ර ලෙස දායක වන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) රත්නපුර දිස්ත්‍රික්කය තුළ පිහිටි අත් යන්ත්‍ර පේෂකර්ම මධ්‍යස්ථාන අතරින් මේ වනවිට ක්‍රියාත්මක වෙමින් පවතින ප්‍රධාන, අනු ශාඛා සහ ගෘහස්ථ මධ්‍යස්ථාන;

(ii) මේ වනවිට වසා දමා ඇති ප්‍රධාන, අනු ශාඛා සහ ගෘහස්ථ මධ්‍යස්ථාන;

සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත (ආ) (ii)හි සඳහන් මධ්‍යස්ථාන වැසී යාමට බලපෑ කරුණු කවරේද;

(ii) එමඟින් අහිමි වූ රැකියා සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) කොලොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ක්‍රියාත්මක වෙමින් පවතින අත් යන්ත්‍ර පේෂකර්ම මධ්‍යස්ථානවල වාර්ෂික පිරිවැටුම කොපමණද;

(ii) මෙම මධ්‍යස්ථාන අධීක්ෂණය කිරීමේ බලය ඇති ආයතනය කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

200/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සංචාරක අමාත්‍යාංශය මේ වනවිට පවත්වාගෙන යනු ලබන ස්ථානයේ ලිපිනය කවරේද;

(ii) එම අමාත්‍යාංශය පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල සඳහා ගෙවනු ලබන මාසික කුලිය කොපමණද;

(iii) එම අමාත්‍යාංශය රජය සතු ගොඩනැගිල්ලක් වෙත ගෙන යාම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

317/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මළල ක්‍රීඩාව දියුණු කිරීම වෙනුවෙන් 2019 වර්ෂය සඳහා වෙන් කළ මුදල කොපමණද;

(ii) එම මුදලෙන් රජයේ පාසල් සඳහා වෙන් කළ මුදල කොපමණද;

(iii) ඉහත (i) හි සඳහන් මුදලෙන් පාසල් හැර ගිය දරුවන්ගේ මළල ක්‍රීඩා හැකියාව වර්ධනය කිරීම සඳහා වෙන් කළ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මළල ක්‍රීඩාවෙන් ජාත්‍යන්තර ජයග්‍රහණ ලබා ගැනීම වෙනුවෙන් පාසල් ක්‍රීඩකයන් මෙහෙයවීම සඳහා සැලසුම් සකස් කිරීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකා මළල ක්‍රීඩා සංගමය හා ඊට අනුබද්ධ අනෙකුත් සංගම්වල පරිපාලන හා සංවර්ධන කටයුතු සඳහා රජය සම්බන්ධ වන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා සම්බන්ධ වන ආකාරය කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

438/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන්ගේ කුසලතා වර්ධනය වෙනුවෙන් ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථාන පිහිටුවා ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම මධ්‍යස්ථාන පිහිටුවීමේදී දිස්ත්‍රික් පදනම හෝ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස පදනම සැලකිල්ලට ගෙන තිබේද;

(iii) එම මධ්‍යස්ථානවලින් පුහුණුව ලබා වාර්ෂිකව පිට වී යන තරුණ තරුණියන් සංඛ්‍යාව දළ වශයෙන් කොපමණද;

(iv) සාර්ථකව පුහුණුව නිම කරනු ලබන තරුණ තරුණියන් රැකියාගත කිරීමේ වැඩපිළිවෙළක් තිබේද;

(v) නොඑසේ නම්, ඔවුන්ගේ අනාගතය සාර්ථක කරන විධිමත් වැඩපිළිවෙළක් සකස් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

528/2020

ගරු රෝහණ බංඩාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති උතුරු මැද පළාත් සභාව යටතේ ක්‍රියාත්මක පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල් කවරේද;

(iii) එම පාසල්වල දැනට පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iv) එම ගුරු පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් විෂයය අනුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම ගුරු පුරප්පාඩු පිරවීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

560/2020

ගරු මයන්ත දිසානායක මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට රජය මඟින් පවත්වාගෙන යනු ලබන වී ගබඩා මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම මධ්‍යස්ථාන පිහිටි ප්‍රදේශ කවරේද;

(iii) පෞද්ගලික අංශය මඟින් පවත්වාගෙන යනු ලබන වී ගබඩා මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් වී ගබඩා මධ්‍යස්ථානය තුළ මේ වනවිට ගබඩා කර තිබෙන වී ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) මෙම ගබඩාවලට අමතරව නව වී ගබඩා මධ්‍යස්ථාන ආරම්භ කිරීමට සැලසුම් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට ගොවීන් සඳහා නොමිලේ පොහොර ලබා දෙන්නේද;

(ii) එසේ නම්, එක් ගොවියෙකු සඳහා ලබා දෙන පොහොර ප්‍රමාණය කොපමණද;

(iii) එසේ නොමිලේ ලබා දෙන පොහොර වර්ග කවරේද;

(iv) ඒ සඳහා රජය විසින් වැය කරන මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

590/2020

ගරු එස්.එම්.එම්.මුෂාරෆ් මහතා,— සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පිහිටා ඇති සුප්‍රසිද්ධ සංචාරක කලාපයක් වන අරුගම්බේ වෙරළ ප්‍රදේශය, මුහුදු රළ මත ලිස්සා යෑමේ ක්‍රීඩාව සඳහා ලෝකයේ පවතින මුල් ස්ථාන 10 අතරට අයත් වන බව දන්නෙහිද;

(ii) එසේ නම්, අරුගම්බේ ප්‍රදේශය මේ වනතෙක් සංචාරක කලාපයක් බවට ප්‍රකාශයට පත් නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සංචාරකයන් විශාල පිරිසක් පැමිණෙන ස්ථානයක් වූ අරුගම්බේ ප්‍රදේශයේ සංචාරකයන් සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ප්‍රමාණවත් පරිදි නොමැති බව දන්නේද;

(ii) එසේ නම්, සංචාරකයන් සඳහා ප්‍රමාණවත් පරිදි යටිතල පහසුකම් සැපයීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

636/2020

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මඩකළපුව දිස්ත්‍රික්කය තුළ පිහිටා ඇති දෙමළ ජාතික නියෝජිතයන් බහුතරයක් සිටින ප්‍රාදේශීය සභා, නගර සභා ලෙස උත්ශ්‍රේණිගත කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

642/2020

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) උතුරු මැද පළාතේ පිහිටි පහළ මල්වතුඔය ජලාශය ඉදිකිරීම සඳහා හිටපු අග්‍රාමාත්‍යවරයා විසින් මුල්ගල තබන ලද බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය කවරේද;

(ii) එහි ඇස්තමේන්තුගත පිරිවැය කොපමණද;

(iii) වාරිමාර්ග දෙපාර්තමේන්තුව, චීන සමාගම යන ආයතන දෙක අතරින් මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් සිදු කරනු ලබන ආයතනය කවරේද;

(iv) ඉදිකිරීම් කටයුතු චීන සමාගම විසින් සිදු කරනු ලබන්නේ නම්, ඒ සඳහා ඇස්තමේන්තුගත පිරිවැය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

722/2020

ගරු වාල්ස් නිර්මලනාදන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිස්ත්‍රික්කයේ ජනතාවට සෞඛ්‍ය සේවා සපයන මන්නාරම දිස්ත්‍රික් රෝහලේ බාහිර රෝගී අංශයේ ගොඩනැගිල්ල ඉතා පැරණි බවත්;

(ii) එම රෝහලේ බාහිර රෝගී අංශය සහ දැඩි සත්කාර ඒකකය ඉදිකරන බවට පසු ගිය කාලයේදී පොරොන්දු වුවද, මේ වනතෙක් එහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොමැති බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) එම ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන දිනය කවරේද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) බොහෝ වෛද්‍ය පරීක්ෂණ එම රෝහලේ සිදු නොකරන බවත්;

(ii) සී.ටී. ස්කෑන් (CT SCAN), ස්නායුවේද (NEUROLOGY), උගුර - කණ - නාසය (ENT), විකලාංග (ORTHOPAEDIC), නියෝප්ලස්මාවේදය (ONCOLOGY), මෛත්‍රික රෝග චිකිත්සාව (UROLOGY), වෘක්කවේදය (NEPHROLOGY), වක්ත්‍ර, මුඛ හා හණුකවේදය (OMF) යන ක්ෂේත්‍රයන්ට අදාළ පරීක්ෂණ මෙම රෝහලේදී සිදු කිරීමට නොහැකි තත්ත්වයක් පවතින බවත්;

එතුමිය දන්නෙහිද?

(ඈ) ඉහත ක්ෂේත්‍රයන්ට අදාළ පරීක්ෂණ මන්නාරම දිස්ත්‍රික් රෝහල තුළ සිදු කිරීම, නැවත ආරම්භ කළ හැකිද යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2021 අප්‍රේල් 20 අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

36/2020

ගරු හේෂා විතානගේ මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 සිට 2019 දක්වා වර්ෂවලදී ශ්‍රී ලංකාවට ආනයනය කර ඇති සහල් ප්‍රමාණය;

(ii) ඒ අනුව එම වර්ෂවලදී සහල් ආනයනය සඳහා වැය කර ඇති සම්පූර්ණ මුදල;

එක් එක් වර්ෂය සඳහා වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත කී වර්ෂවල සහල් ආනයනයේ කිරීමේදී සහල් කිලෝවක් සඳහා අය කරන ලද බදු මුදල;

(ii) ඉහත වර්ෂවලදී සහල් ආනයනය සඳහා අය කරන ලද මුළු බදු මුදල් ප්‍රමාණය;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත වර්ෂවලදී සහල් මිල උච්චාවචනය වූයේ කවර ආකාරයෙන්ද යන්න වර්ෂ අනුව වෙන් වෙන් වශයෙන් පූර්ණ වාර්තාවක් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

203/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික තරුණ සේවා සභාවේ නව අධ්‍යක්ෂ මණ්ඩලයේ එක් එක් සාමාජික/ සාමාජිකාවගේ නම, ලිපිනය, අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) තරුණ සංවර්ධනය සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ ඉදිරි දැක්ම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

230/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂයක් තුළ—

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ දැව ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය වූ මුදල කොපමණද;

(iii) එම දැව ආනයනය කළ රටවල් කවරේද;

(iv) එම දැව ආනයනය කළ සමාගම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට දැව ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

356/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර, නිල්වලා ගඟට අපද්‍රව්‍ය බැහැර කිරීම හේතුවෙන් එම ගඟ අපිරිසිදු වී ඇති බවත්;

(ii) මාතර දිස්ත්‍රික්කයේ ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වයට එය අහිතකර ලෙස බලපා ඇති බවත්;

(iii) ජලයේ ගුණාත්මක බව රැක ගැනීම පිණිස නිල්වලා ගඟ දෙපස රක්ෂිත ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කළ යුතු බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) නිල්වලා ගඟ දෙපස අඩි 33ක රක්ෂිත ප්‍රදේශයක් ස්ථාපනය කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) 2016 වර්ෂය තුළ නිල්වලා ගඟට අපද්‍රව්‍ය බැහැර කිරීම හේතුවෙන් පුද්ගලයන් අත්අඩංගුවට ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

539/2020

ගරු රෝහණ බංඩාර මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වන අලි තර්ජනයට මුහුණ දී සිටින අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටි ගම්මාන සංඛ්‍යාව කොපමණද;

(ii) 2015 වර්ෂයේ සිට මේ දක්වා අලි-මිනිස් ගැටුම හේතුවෙන් මිය ගිය පුද්ගලයන් සංඛ්‍යාව හා දේපළ හානි සිදුවීම් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පවතින අලි-මිනිස් ගැටුමට ස්ථිර විසඳුමක් ලබා දීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

603/2020

ගරු ඉෂාක් රහුමාන් මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 308 ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ආසිරිගම මාර්ගයේ කාගොල්ලෑව හන්දියේ සිට කටුකැලියාව හන්දිය දක්වා කිලෝ මීටර් 2 ක පමණ දුර ප්‍රමාණයකින් යුක්ත වූ කොටස ඉතාමත් අබලන් තත්ත්වයේ පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම මාර්ග කොටස අලුත්වැඩියා කිරීමට අවශ්‍ය පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

620/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) වෛද්‍ය උපාධි ප්‍රදානය කරනු ලබන ජාත්‍යන්තර විශ්වවිද්‍යාල කිහිපයක් අසාදු ලේඛනයට ඇතුලත් කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාව තීරණය කර තිබේද;

(ii) එසේ නම්, එම විශ්වවිද්‍යාලවල නම් කවරේද;

(iii) එවැනි තීරණයක් ගැනීමට හේතු වූ කරුණු කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා ඉහත (අ) (ii) හි සඳහන් විශ්වවිද්‍යාලවලින් උපාධි ලබාගත් ශ්‍රී ලාංකික ශිෂ්‍යයන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම විශ්වවිද්‍යාල සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් ගනු ලබන ඉදිරි ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

717/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ක්‍රීඩකයන් සංචිත ගත කර පුහුණුව ලබා දීම තුළින් සාර්ථක ප්‍රතිඵල ලබා ගත හැකි බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) මේ වනවිට අමාත්‍යාංශයේ අනුග්‍රහය යටතේ පවත්වාගෙන යනු ලබන ක්‍රීඩා සංචිත සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංචිත පවත්වාගෙන යනු ලබන ක්‍රීඩා කවරේද;

(iii) මළල ක්‍රීඩාව සඳහා වන ජාතික සංචිතය පවත්වාගෙන යනු ලබන ස්ථානය කවරේද;

(iv) එම සංචිතයේ මේ වනවිට පුහුණුව ලබන ක්‍රීඩක ක්‍රීඩිකාවන් සංඛ්‍යාව කොපමණද;

(v) එම ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ප්‍රමාණවත් පහසුකම් ලබා දී තිබේද;

(vi) නොඑසේ නම්, ඒ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

753/2020

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ සිට පොළොන්නරුව දක්වා ධාවනය කරනු ලබන දුම්රිය, මඩකලපුව දක්වා ධාවනය නොකිරීමට හේතු කවරේද;

(ii) මඩකළපුව දිස්ත්‍රික්කයේ පිහිටා ඇති දුම්රිය මාර්ග පිළිසකර කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

763/2020

ගරු අමරකීර්ති අතුකෝරළ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පොළොන්නරුව දිස්ත්‍රික්කයට අයත් වන —

(i) අධ්‍යාපන කොට්ඨාස සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(ii) ජාතික පාසල් සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(iii) පළාත් පාසල් සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(iv) මෙම පාසල්වල මේ වනවිට පවතින ගුරු හිඟය කොපමණද;

(v) පසුගිය වර්ෂ 5 තුළ වැසී ගිය පාසල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පොළොන්නරුව දිස්ත්‍රික්කයට අයත්වන පාසල් අතරින්—

(i) අ.පො.ස. (උ/ පෙළ) සඳහා අදාළ වන විෂය ධාරා හතරක්, විෂය ධාරා තුනක්, විෂය ධාරා දෙකක්, හා එක් විෂය ධාරාවක් පමණක්;

(ii) අ.පො.ස. (සා/ පෙළ) විභාගය දක්වා;

(iii) පහ ශ්‍රේණිය දක්වා;

ඉගැන්වීම් කටයුතු සිදුකරනු ලබන පාසල් සංඛ්‍යාව අධ්‍යාපන කොට්ඨාස අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පොළොන්නරුව දිස්ත්‍රික්කයට අයත්වන පාසල්වල සේවයේ නියුතු මුළු ගුරුවරුන්, උපාධිධාරී ගුරුවරුන්, පුහුණු ගුරුවරුන්, විද්‍යාපීඨ ගුරුවරුන් හා අනෙකුත් ගුරුවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

පා.72/2021

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

ගරු (වෛද්‍ය) සීතා අරඹේපොල මහත්මිය

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය

ගරු තලතා අතුකෝරල මහත්මිය

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය

ගරු මංජුලා දිසානායක මහත්මිය

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය

ගරු ඩයනා ගමගේ මහත්මිය, — ශ්‍රී ලංකාව තුළ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වී කරනු ලබන වෙනස්කම් සහ කාන්තාවන්ගේ අයිතිවාසිකම් කඩවීම් පිළිබඳව විශේෂ අවධානය යොමු කරමින්, ස්ත්‍රී-පුරුෂ සමතාව සහ සමානාත්මතාවය තහවුරු කිරීමට සහ ඒ පිළිබඳව සොයා බලා සිය නිර්දේශ පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,— නීතිය ඉදිරියේදී සියලුම පුද්ගලයන් එක සමාන වන බව සහ සියලුම පුද්ගලයන්ට නීතියේ සමාන ආරක්ෂාව හිමිවන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පිළිබඳ පරිච්ඡේදයේ 12 ව්‍යවස්ථාව මඟින් පිළිගෙන තිබෙන හෙයින් ද;

කාන්තා අයිතිවාසිකම්වල ප්‍රගතිය උදෙසා වෙනස්කම්වලට ලක්වූවන් සම්බන්ධයෙන් හිතකර ව්‍යවස්ථාදායක හෝ විධායක ක්‍රියාමාර්ග ගැනීම සඳහා 12(4) ව්‍යවස්ථාව මඟින් විධිවිධාන සලසා ඇති හෙයින් ද;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය, මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය (UDHR); සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය (ICCPR); ආර්ථික, සමාජීය සහ සංස්කෘතිකමය අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය (ICESCR); සහ කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කොට සැලකීම්වලට එරෙහි සම්මුතිය (CEDAW) වැනි සමානාත්මතාවය ප්‍රවර්ධනය කරනු ලබන ජාත්‍යන්තර නෛතික සාධනපත්‍ර ගණනාවක් අපරානුමත කර ඇති හෙයින් ද;

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් සම්මත කර ගෙන ඇති, ශ්‍රී ලංකාව ද අත්සන්කාර පාර්ශ්වයක් වන, තිරසර සංවර්ධන ඉලක්ක සන්දර්භය තුළ ස්ත්‍රී-පුරුෂ සමතාව සහ සමානාත්මතාවය සහතික කිරීම සහ සියලුම කාන්තාවන් සහ දැරිවියන් සවිබල ගැන්වීම වැදගත් වී ඇති හෙයින් ද;

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මියගේ සභාපතිත්වයෙන් යුත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය විසින් ඔවුන්ගේ නියෝජන, නීතිකරණ, අයවැයකරණ සහ අධීක්ෂණ කාර්යයන් හරහා ස්ත්‍රී-පුරුෂ සමතාව සහ සමානාත්මතාවය වෙනුවෙන් පෙනී සිටීමට සහ ප්‍රධාන ප්‍රවාහයට ගෙන ඒම සඳහා යාන්ත්‍රණයක් සකස් කිරීමේ අවශ්‍යතාවය සම්මත කර ගෙන ඇති හෙයින් ද; සහ

ස්ත්‍රී-පුරුෂ සමතාව සහ සමානාත්මතාවය ප්‍රවර්ධනය කරමින් එයට ගරු කරනු ලබන බව සහ ශ්‍රී ලංකාව තුළ සියලුම කාන්තාවන් සහ දැරිවියන් සවිබල ගන්වනු ලබන බව සහතික කරමින් ද, ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම්ව කරනු ලබන වෙනස්කොට සැලකීම්වලට ලක්වූ අයගේ නොවිසඳී ඇති ගැටලුවලට පිළියම් සෙවීම සඳහා පහත කරුණු සම්බන්ධයෙන් සොයා බලා ඒ පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මතකර සිටියි: —

(අ) රැකියා, උසස්වීම් අවස්ථා සහ සේවා ස්ථානයේදී සිදු වන හිංසනයන් ඇතුළුව ස්ත්‍රී - පුරුෂ සමාජභාවය මත පදනම්ව කරනු ලබන සියලු ආකාරයේ වෙනස්කොට සැලකීම් පිළිබඳ කාන්තාවන්ගේ දුක්ගැනවිලි විභාග කර බැලීම;

(ආ) සියලු ම අංශවලට සහ සියලු ම මට්ටම්වලට ප්‍රමාණවත් අභ්‍යන්තර සම්පත් වෙන් කර දීම සහ ශ්‍රී ලංකාව තුළ ස්ත්‍රී-පුරුෂ සමතාව සහ සමානාත්මතාවය වැඩිදියුණු කිරීම සඳහා ඇති ප්‍රවේශය සමාලෝචනය කිරීම සහ ඒ වෙනුවෙන් පෙනී සිටීම;

(ඇ) වෙනස්කොට සලකනු ලැබීම සහ කාන්තාවන්ගේ සහ දැරිවියන්ගේ ජීවිත කෙරෙහි ඇති වන සෘණාත්මක බලපෑම වැළැක්වීම පිණිස ස්ත්‍රී-පුරුෂ සමාජභාවය ප්‍රධාන ප්‍රවාහයට ගෙන ඒම සහතික කරමින් අදාළ නීති පරීක්ෂා කර බැලීම සහ සමාලෝචනය කිරීම;

(ඈ) ස්ත්‍රී-පුරුෂ සමාජභාවය අරමුණු කර ගත් සැලසුම් සකස් කිරීම සහ මූල්‍ය සම්පාදනය සහතික කරලනු පිණිස අදාළ රේඛීය අමාත්‍යාංශ සහ අධිකාරීන් දිරිමත් කිරීම;

(ඉ) පිරිමින් සහ කාන්තාවන් අතර සමානාත්මතාවය සාක්ෂාත් කර ගැනීමට අදාළ වන කරුණු පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සහ තොරතුරු ප්‍රචාරණය කිරීම දිරිමත් කිරීම;

(ඊ) ජාතික, පළාත් සහ ප්‍රාදේශීය මට්ටමේ සහ රාජ්‍ය, සිවිල් සමාජ සහ පෞද්ගලික අංශවල තීරණ ගැනීමේ කණ්ඩායම් තුළ, වැඩි කාන්තා නියෝජනයක් ඇති කිරීම සඳහා පෙළඹවීම සහ ඒ වෙනුවෙන් පෙනී සිටීම;

(උ) ජාතික, පළාත් සහ ප්‍රාදේශීය මට්ටම්වලදී ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ මූලධර්ම සංකලනය කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග සමාලෝචනය කිරීම;

(ඌ) ශ්‍රී ලංකාව තුළ ස්ත්‍රී-පුරුෂ සමතාව සහ සමානාත්මතාවය වැඩිදියුණු කිරීම සඳහා රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරීත්වයන් දිරිමත් කිරීම;

(එ) කලාපීය සහ ජාත්‍යන්තර මට්ටමෙන් රටවල් අතර විශේෂඥ දැනුම සහ අත්දැකීම් බෙදා ගැනීම සහ අනෙකුත් රටවල පාර්ලිමේන්තුවලින් උගත් පාඩම් සමාලෝචනය කිරීම; සහ

(ඒ) ඉහත සඳහන් කරුණු හා සම්බන්ධ හෝ එම කරුණුවලට ආනුෂංගික සියලු කාරණා පිළිබඳ සළකා බැලීම.

2. (අ) එකී කාරක සභාව සහ එහි සභාපතිවරයා කථානායකවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය; සහ

(ආ) පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 101 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, කාරක සභාව, පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයේ සියලුම සාමාජිකාවන් සහ සියලුම දේශපාලන පක්ෂ නියෝජනය කරන වෙනත් මන්ත්‍රීවරයන් ද ඇතුළත්ව සාමාජිකයන් විසිපහකට (25) නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත යුතු ය.

3. එම කාරක සභාවට —

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) ඉහත සඳහන් කර ඇති කරුණු පූර්ණ වශයෙන් සලකා බැලීම සඳහා කාරක සභාව විසින් අවශ්‍ය යැයි තීරණය කරනු ලබන පරිදි, ඕනෑම පුද්ගලයෙකු එම කාරක සභාව ඉදිරියට කැඳවීමට ද, ඕනෑම ලියවිල්ලක් හෝ වාර්තාවක් ලබා දෙන ලෙසට ඕනෑම පුද්ගලයෙකුට නියම කිරීමට ද, එකී සියලු සාක්ෂි, ලිඛිත හෝ වාචිකව, ලබා දීමට හෝ ලබා ගැනීමට ද;

(ඇ) කාරක සභාවට සහාය වීම පිණිස අදාළ ක්ෂේත්‍රවල විශේෂඥයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීමට ද; සහ

(ඈ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද, පාර්ලිමේන්තුව කල් තබන ලද්දේ වුවද රැස්වීම් පවත්වා ගෙන යාමට ද

බලය තිබිය යුතුය.

4. සිය පළමු රැස්වීම් දිනයේ සිට එක් වසරක කාලයක් තුළ හෝ පාර්ලිමේන්තුව විසින් ලබාදෙන අන් කවර හෝ අමතර කාලසීමාවක් තුළ හෝ කාරක සභාව විසින් සිය වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.

5. කාරක සභාවේ වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීමෙන් අනතුරුව එම වාර්තාව අදාළ විෂය භාර අමාත්‍යවරයන් වෙත යොමු කරනු ලැබිය යුතු අතර, ඒ සම්බන්ධයෙන් සිය නිරීක්ෂණ සහ ගන්නා ලද පියවර සති අටක (08) කාල සීමාවක් ඇතුළත දී, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුත්තේ ය.